**ජාතික ලොතරැයි මණ්ඩලය - 2018**

---------------------------------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ලොතරැයි මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍යප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍යප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට , මාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ .වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර ,ජ ලේඛන සැකසීමව්‍යා ,දූස්සන්ධානය , .න්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේචේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යා
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්න්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ අභ්‍ය , .කාශ කිරීමට අදහස් නොකරයිමතයක් ප්‍ර
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද භාගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදීමාණවත් අවිනිශ්චිතතාවක් ඇති බවට මා නිප්‍ර .ගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතරඑම හෙළිදරව් කිරීම , ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවදඅනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම , අවසන්විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා ව්‍යූ , කාශනවල ප්‍රසිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍යඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානයවාර්තා හා වෙනත් ,පොත්පත් ,පරිපාටි ,පද්ධති , ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධතිවාර්තා හා වෙනත් ,පොත්පත් ,පරිපාටි , ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මණ්ඩලය ,ක්‍රියා කර ඇති බව,
- සිය බලතල ,කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙසකාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ , නිතීරීතිවලට අනුකූලවප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට අනුකූල නොවීම | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 හි 4.1.1 ඡේදයට අනුකූල නොවන ලෙස මණ්ඩලයේ මූල්‍ය වත්කම් වර්ගීකරණය කර තිබුණි. | 2019 වර්ෂයේ දී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලටඅනුව ගිණුම් පිළියෙල කල යුතු බව. |
| (ආ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 13හි91 වනඡේදයට අනුකූලවන පරිදි සාධාරණ අගය මැනීමපිළිබඳ මණ්ඩලයේගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි. | 2019 වර්ෂයේදී හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමි. | - එම - |
| (ඇ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 හි110 වන ඡේදයේ අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි මණ්ඩලය විසින් පිළියෙල කල මූල්‍ය ප්‍රකාශනවල අදාල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | - එම - | - එම - |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01**

| | | | |
|---|---|---|---|
| (i) | මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන් අංක 1.4 හා 2.1.2 ඡේදය මඟින් වාර්තා කර තිබුණද සටහන් අංක 2.7 මගින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 සහ 15 අනුගමනය නොකළ බව වාර්තා කර තිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදිව ප්‍රතිපත්තිවල සඳහන් කිරීමට සටහන් කර ගතිමි. | මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුව ගිණුම් පිළියෙල කල යුතු බව |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ මහජන ඇමතුම් පද්ධතිය නියමිත දිනට ආයතනයට නොසැපයීම් මත අයකරගෙන තිබූ රු.488,000ක මුදල වෙනත් ආදායම් ලෙස නොසලකා උක්ත ප්‍රමිතියේ ඡේදයට පටහැනිව 32 | මෙම ගැලපීමට පසු අය කර ගත් දඩ මුදල්,ආදායම් යටතේ දඩ මුදල් ගිණුමට ගිණුම්ගත කර ඇති අතර ඉදිරියේ වියදමට හිලව් කර ගිණුම්ගත කිරීම සිදු | - එම - |

| | | | |
|---|---|---|---|
| | මහජන ඇමතුම් පද්ධතියේ පිරිවැයෙන් අඩුකර දක්වා තිබුණි. | නොවේ. | |
| (iii) | ප්‍රමිතයේ 69 ඡේදයට පටහැනි ලෙස පෙර වර්ෂවලදී ජංගම වගකීම් ලෙස හඳුනා ගෙන තිබුණු රු.9,063,436 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගතකර තිබුණි. මෙම ක්‍රමවේදය මණ්ඩලය විසින් පෙර වර්ෂවල සිටම දිගින් දිගටම අනුගමනය කරන බව නිරීක්ෂණය විය. | මෙවැනි ගැලපීම් අවම වන ලෙස ඉදිරියේදී කටයුතු කිරීමට පියවර ගනු ඇත. | - එම - |
| (iv) | ප්‍රමිතියේ 69 වන වගන්තියට පටහැනි ලෙස පෙර වර්ෂවලදී ජංගම වගකීම් ලෙස ඇස්තමේන්තුගත කර තිබූ රු.16,141,331 ක මුදලක් සමාලෝචිතවර්ෂයේදී වියදම්වලින් අඩුකිරිම නිසා ප්‍රවර්ථන වර්ෂයේ සත්‍ය වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |
| (v) | රු.286,551,044 ක් වූ ජාතිය ගොඩගැනීමේ බදු වියදම ප්‍රමිතයේ 103 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් යටතේ වර්ගකර නොතිබුණි. | 2018 සංශෝධිත අවසාන ගිණුම්වල විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් ලෙස පෙන්නුම් කර ඇත. | - එම - |

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07**

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රවර්ථන වර්ෂයේ ඇති නොවූ මෙන්ම සහ ආදායම් ප්‍රකාශයේද අඩංගු නොවන රු.82,494 ක වත්කම් ඉවත් කිරීමේ අලාභයක් ප්‍රමිතයේ 18(ආ) ඡේදයට පටහැනි ලෙස බදු පෙර ලාභයට එකතුකර තිබුණි. | (i), (ii), (iii), (iv), (v), (vi) ඉදිරියේදී මුදලින් ගෙවන ලද සහ මුදලින් ලැබූ වටිනාකම් සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලටඅනුව ගිණුම් පිළියෙල කල යුතු බව |
| (ii) | ප්‍රවර්ථන වර්ෂයේ මුදලින් ගෙවන ලද ආදායම් බදු වටිනාකම රු.483,706,173 ක් වුවද ප්‍රමිතයේ 35 ඡේදයට අනුකූල නොවන ලෙස එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.498,037,403 ක් ලෙස දක්වා තිබුණි. මණ්ඩලයේ පොළී ආදායම් මත වූ රඳවාගැනිමේ බදු වටිනාකම ආදායම් බදු වටිනාකමට එකතු කර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබීම මෙයට හේතු වී තිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂය තුළ වරාය අධිකාරියට ගෙවීම් කරන ලද රු.1,371,712 ක දිගුකාලීන වගකීම්, ප්‍රමිතයේ 17 ඡේදය ප්‍රකාරව මූල්‍යක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. කෙසේ වුවද මෙම වගකීමට අදාල වර්ෂයේ ආරම්භක ශේෂය හා වර්ෂයේ අවසාන ශේෂය අතර වෙනස වූ රු.4,115,137 ක මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | - එම - | - එම - |
| (iv) | සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේදී මුදලින් කර ඇති ගෙවීම් රු.62,697,098 ක් වුවද ප්‍රමිතයේ 16(අ) ඡේදයේ උපදෙස් නොසලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.74,300,042 ක් ලෙස දක්වා තිබුණි. | - එම - | - එම - |
| (v) | සමාලෝචිත වර්ෂය තුළ මුදලින් ලද සංචාරක බංගලා කුලී ආදායම හා වාහන කුලී ආදායම රු 1,768,785.ක් වුවද ප්‍රමිතයේ ඡේදයේ උපදෙස් 16 වාහ සැලකිල්ලට නොගෙන මුදල් ප්‍ර කාශයේ එයප්‍ර රු.1,728,365 ක් ලෙස දක්වා තිබුණි.අදාළව ඉකුත් වර්ෂයට ල වර්ෂයේ මුදලින් සමාලෝචිතද රු.40,420 ක ආදායම සැලකිල්ලට නොගැනීම මෙම වෙනසට හේතු වී තිබුණි . | - එම - | - එම - |
| (vi) | සමාලෝචිත වර්ෂයේ ත්‍යාග සංචිතයේ වෙනස්වීම වූ රු.430,370,642 ක වටිනාකම ප්‍රමිතයේ 35 ඡේදයට පටහැනිව මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | - එම - | - එම - |
| (vii) | විදේශ ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යනු ලබන ණයගැතියන්ගෙන් ජනිත වූ විදේශ විනිමය විචලන ලාභය වූ රු.940,502 ක වටිනාකම එම ණයගැතියන්ගේ ආරම්භක ශේෂයට ගැලපීම් නොකර මුදල් පොතේ ආරම්භක ශේෂයට ගලපා තිබීම හේතුවෙන් වෙළඳ ණයගැතියන්ගේ විචලනය නිවැරදි ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිරූපණය කර නොතිබුණි. | 2019 වර්ෂයේදී ණයගැති ආරම්භක ශේෂය ගැලපීම සිදු කිරීමට සටහන් කර ගතිමි. | - එම - |

| | | |
|---|---|---|
| (viii) ඉහත සඳහන් පරිදි මෙම ප්‍රමිතයේ උපදෙස් නොසලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීම හේතුවෙන් කාරක ප්‍රාග්ධනය තුළනිරූපනය කරන තොග අඩුවීම රු.8,500,000 ක් වැඩියෙන් ද වෙනත් ජංගම වත්කම්වල වැඩිවීම රු.14,371,650ක් අඩුවෙන් ද සහ වෙළෙඳ සහ වෙනත් වගකීමවල වැඩිවීම රු.8,507,299 ක් වැඩියෙන් ද දක්වා තිබුණි. | ඉදිරියේදී මුදලින් ගෙවන ලද සහ මුදලින් ලැබූ වටිනාකම් සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමට කටයුතු කරනු ලැබේ. | - එම - |

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12**

| | | |
|---|---|---|
| මණ්ඩලයේ ආදායම් බදු ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන සමග වූ සටහන් අංක 2.3.4 මගින් වාර්තා කර තිබුනද ප්‍රමිතයේ61(ඒ) ඡේදයට අනුකූලවන පරිදි ආදායම් බදු සම්බන්ධයෙන් මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 අනුවගිණුම්කරණ ප්‍රතිපත්තිවල 2.3.4 යටතේ විස්තරාත්මකව දක්වා ඇත. | - එම - |

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක16**

| | | |
|---|---|---|
| මණ්ඩලය සතු නිෂ්ක්‍රීය වත්කම් සහ අගය සම්පූර්ණයෙන් ලියාහැර ඇති නමුත් තවදුරටත් භාවිතයට ගන්නා වත්කම්වල ධාරන අගය ප්‍රමිතයේ 79 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 අනුව 2019 වර්ෂයේදී නිවැරදිව ප්‍රතිපත්තිවල සඳහන් කිරීමට සටහන් කර ගතිමි. | - එම - |

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලය විසින් සේවක පාරිතෝෂික ලෙස රු.52,031,249 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද එයට සුදුසු සැලසුම් සකස් කර නොතිබුණි. එසේම ප්‍රමිතයේ 135 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරි අලාභය හඳුනාගැනීමසම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනුව 2019 වර්ෂයේදී ආයෝජන සැලැස්ම හා ආයෝජනය කළ ආකාරය හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමි. | - එම - |

**(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20**

| | | |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය විසින් මණ්ඩලයට ප්‍රදානය කර තිබූ රු.5,795,000 ක මෝටර් රථයේ වටිනාකම ප්‍රමිතයේ 25 ඡේදයට පටහැනි ලෙස මුළුමනින්ම වෙනත් ආදායමක් ලෙස ඉකුත් වර්ෂයේදී ආදායම් ප්‍රකාශයේ දක්වා තිබුණි. ප්‍රවර්තන වර්ෂයේදී ද එම වරද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ අනුව තවදුරටත් | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව 2019 වර්ෂයේදී නිවැරදිව ගිණුම්වලට ගැලපීමට සටහන් කර ගතිමි. | - එම - |

| | | |
|---|---|---|
| රු.2,776,770 ශුද්ධ වටිනාකමක් ඇති මෙම මෝටර් රථය ප්‍රදානයක ස්වරූපයකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. | | |
| **(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24** | | |
| (i) ප්‍රමිතියේ 17 ඡේදය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 25 වන ඡේදය ප්‍රකාරව පහත සඳහන් කළමනාකරණ හා සේවක ප්‍රතිලාභ වර්ගවල එකතුන් වෙන් වෙන් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.<br>• කෙටිකාලීන සේවක ප්‍රතිලාභ<br>• පශ්චාත් සේවා ප්‍රතිලාභ<br>• වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ<br>• සමාජ ප්‍රතිලාභ | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 අනුව (i), (ii) ඡේදවල දක්වා ඇති තොරතුරු 2019 වර්ෂයේදී නිවැරදිව හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමි. | - එම - |
| (ii) ප්‍රමිතයේ 18 ඡේදය ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවද මණ්ඩලයේ වර්තමාන අධ්‍යක්ෂ ධූරයක් දරන සාමාජිකයකු එම ධූරය දැරීමට පෙර මණ්ඩලයේ දිස්ත්‍රික් අළෙවි නියෝජිතයෙකු ලෙස කටයුතු කළ කාලය තුලදී ඔහුට ගෙවිය යුතු රු.102,018 ක මුදල, ණයගැති ශේෂය තුල පැවතුණි. එහෙත් එම වටිනාකමට නියමිත පරිදි වෙනමම හෙළිදරව් කර නොතිබුණි. | - එම - | - එම - |
| **(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40** | | |
| මණ්ඩලය සතු සංචාරක නිවාසවල වටිනාකම් ආයෝජන දේපල යටතේ නිරූපනය කර තිබුණද අනුරාධපුර සංචාරක බංගලාව පිහිටි ඉඩමේ ඉදිකල රු.1,086,820 ක අනෙකුත් කාර්යාල ගොඩනැගිලි පිරිවැයද ආයෝජන දේපල යටතේ අනාවරණය කර තිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 අනුව 2019 වර්ෂයේ අවසාන ගිණුම්වල මේ පිළිබඳ අනාවරණය කිරීම සම්බන්ධයෙන් සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ගිණුම් පිළියෙල කල යුතුබව. |

**1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ උපචිත වියදම් සඳහා තාත්වික පදනමින් ප්‍රතිපාදන සැලසීම වෙනුවට අයවැය ගත දත්තයන් සැලකිල්ලට ගෙන උපචිත වියදම් සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ උපචිත වියදම් අධි ප්‍රතිපාදනය රු.8,732,081 ක් වී තිබුණි. | මණ්ඩලය අයවැයගත දත්තයන් මත උපචිත වියදම් සඳහා ප්‍රතිපාදන සකසා නොමැති අතර ලබා ගත හැකි උපරිම තාත්වික දත්තයන් උපයෝගී කර ගෙන උපචිත වියදම් ප්‍රතිපාදන සකසා ඇත. | සත්‍ය ලෙස ගෙවියයුතු වටිනාකම් උපචිත වියදම් ලෙස ගිණුම් ගත කිරීම. |

**1.5.4 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉතිරිව පැවති ලොතරැයිපත්වල සුන්බුන් අගය වූ රු.809,062 ක මුදල සඳහා ගිණුම්වල අවශ්‍ය ගැළපීම් සිදු නොකර ඒවායේ මුද්‍රණ පිරිවැය වූ රු.40,352,380 ක් වූ සම්පූර්ණ මුදලම විකුණුම් පිරිවැය තුළ අන්තර්ගත කර තිබුණි. | 2019 වර්ෂයේදී නොවිකුණූ ලොතරැයිපත්වල සුන්බුන් අගය ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ මූලධර්ම අනුව කටයුතු කල යුතු බව. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද දිනුම් වාරයන් වෙනුවෙන් ත්‍යාග සඳහා වෙන් කිරීම්වලින් ඉතිරිව පැවති රු.430,370,642 ක මුදල රඳවාගත් ලාභයට ගැලපුම් කළ යුතු වුවද එය සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉතිරිව පැවති ත්‍යාග සඳහා වෙන් කිරීම් මාස 06 ක් ඉකුත් වූ පසු භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන බැවින් එකී ප්‍රමාණය රඳවා ගත් ලාභයට ගැලපීම අවශ්‍ය නොවේ. | ත්‍යාග සඳහා වෙන්කිරීම් සිදුකල පසු ත්‍යාගලාභීන් බිහි නොවූ ත්‍යාගමුදල රඳවාගත් ලාභයට ගැලපීම් මගින් ත්‍යාග සංචිත අරමුදලට බැර කළ යුතු බව. |
| (ඇ)මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු ගණනය කිරීමේදී අධිභාර හා ඒ මත වූ වෙනත් වියදම් ලෙස වරාය අධිකාරියට ගෙවන ලද රු.10,973,697 ක මුදලක් මණ්ඩලයේ වියදම් ලෙස සැලකිල්ලට ගෙන තිබුණි. මෙම | 2018 අවසාන ගිණුම් තුළින් නිවැරදි කර ඇත. | පවත්නා ආදායම් බදු පනත අනුව කටයුතු කල යුතු බව. |

| | | |
|---|---|---|
| වියදම ඉකුත් වර්ෂවලට අදාලව මණ්ඩලය විසින් පියවියයුතු වියදමක් බව නිරීක්ෂණය වූ අතර නව දේශීය ආදායම් පනතේ 10 ආ (iii) හා 11(i)ඡේදයන්ට අනුව මෙම වියදම් ලාභයට එරෙහිව කපා හැරිය නොහැකි වියදම් බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදු වටිනාකම රු.3,070,635 කින් ඌන තක්සේරු වී තිබුණි. | | |
| (ඇ) ජාතික ලොතරැයි මණ්ඩලයට අදාල ආදායම් බදු අනුපාතිකය 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතට අනුව සියයට 40 ක් වුවද 2018 අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනතට අනුව එය සියයට 28 ක් විය. ඒ අනුව මණ්ඩලයේ ගිණුම් කාල පරිච්ඡේදය ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා වුවත් එම කාලපරිච්ඡේදයට අදාලව වාර්ෂික ආදායම් බදු වියදම ගණනය කිරීමේදී ඉහත සඳහන් පැරණි හා නව බදු ප්‍රතිශතයන් දෙකම අදාල විය යුතු විය. ඒ අනුව 2018 ජනවාරි 01 දින සිට 2018 මාර්තු 31 දින දක්වා මුල් කාර්තුවට නව ආදායම් බදු පනතේ 203(1) ඡේදය ප්‍රකාරව පැරණි බදු අනුපාතිකයද අනෙක් කාර්තු 03 සඳහා නව අනුපාතයද යොදා ගැනීම කළ යුතු විය. එහෙත් මණ්ඩලය විසින් සම්පූර්ණ වර්ෂය සඳහාම බදු අනුපාතිකය සියයට 28 ක් ලෙස යොදා ගෙන තිබුණි. ඒ අනුව මුල් කාර්තුව සඳහා ආදායම් බදු වියදම සියයට 12 ක් අඩුවෙන් තක්සේරු කර ඇති බව නිරීක්ෂණය විය. | - එම - | - එම - |
| (ඉ)ඉකුත් වර්ෂයේ ආදායම් බදු ගණනය කිරීමේ දී සැලකිල්ලට ගන්නා ලද එකතුව රු.17,681,257 ක් වූ ඉඩදිය නොහැකි වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී ද අවශ්‍ය ගැළපීම් සිදුකර ඒ මත වූ ආදායම් බදු මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂයේදී ආදායම් බදු ගණනය කිරීමේදී අඩු කිරීම් යටතට නොගැනෙන හානිකරණ අලාභය හා 2017 මණ්ඩලය විසින්ම මණ්ඩලයේ ලොතරැයිපත් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු බදු මුදල් | පවත්නා ආදායම් බදු පනත අනුව කටයුතු කල යුතු බව. |

| | | |
|---|---|---|
| | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණීමෙන් පසුව ගෙවීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ඊ)මණ්ඩලය විසින් පෞද්ගලික බැංකුවක ආයෝජනය කර තිබූ රු.5,336,575 ක මුදලක් 2008 අප්‍රේල් 23 දිනැති අංක 1546/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් රජයට පවරා ගෙන තිබුණද, ඒ සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් නොකර එම මුදල ආයෝජන යටතේ තවදුරටත් දක්වා තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත මේ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් සඳහා යොමු කර ඇත. නමුත් මේ දක්වා ඒ සම්බන්ධව පිළිතුරක් ලැබී නොමැත. | ගිණුම්කරණ මූලධර්ම අනුව කටයුතු කල යුතු බව. |
| (උ)මණ්ඩලය විසින් ඉදිරියේදි පැවැත්වීමට නියමිත ඩොලර් ෆොචූන් ලොතරැයියේ නොවිකිණි ඉතිරි වූ රු.142,636 ක් වටිනා ලොතරැයිපත් 3317 ක් විකුණුම් ලෙස සලකා අවසාන තොගයෙන් අඩුකර දක්වා තිබුණි. | ඩොලර් ෆොචූන් ලොතරැයිය තවමත් අලෙවි වෙමින් පවතින ලොතරැයියක් වන අතර අලෙවිකරණ අංශය හාමුලා අංශය එක්ව මේ සම්බන්ධව සොයාබලා කටයුතු කිරීමට අපේක්ෂිතයි. | භාණ්ඩ සමීක්ෂණය නිවැරදිව සිදු කිරිම. |
| (ඌ)කාර්යමණ්ඩලය සඳහා මිලදීගත් බෙදා නොහැර ඉතිරිවූ වටිනකාම රු.730,625 ක් වූ ටීෂර්ට් 1169 ක් හා නියෝජිතයින් අතර බෙදා නොහරින ලද රු.329,800 ක් වටිනා තෑගි වවුචර් 34 ක් තොග ලේඛනවලට ඇතුලත් වී නොතිබුණි. | ජතික ලොතරැයි මණ්ඩලය කොල්ලුපිටියේ සිට මුදලිගේ මාවත යන ස්ථානයට මාරු කිරීමේදී ඇති වූ කලබලකාරී තත්ත්වය මත ඉල්ලුම් පත්‍ර ලෙජර් පොත්වලට ඇතුලත් කිරීමට නොහැකි වීම මත මෙම වරද සිදු වී ඇත. මේ වන විට එම වරද නිවැරදි කර ඇත. | භාණ්ඩ සමීක්ෂණයේදී තොග ලේඛන නිවැරදිව සැසදීම හා ඒ අනුව කටයුතු කිරීම. |
| (එ)සමාලෝචිත වර්ෂයට අදාළව නීති වියදම් රු.610,155 ක් හා නියෝජිත හා අමතර විකුණුම් ප්‍රවර්ධන වියදම් රු.145,000 ක මුදලක් උපචිත වියදම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | ගිණුම්කරණ මූලධර්ම අනුව කටයුතු කිරීම. |
| (ඒ)සමාලෝචිත වර්ෂය තුළ ප්‍රචාරණ වියදම්වල ඇතුලත්ව ඇති හිමිකම් නොපෑ රු.865,000 ක් අනුග්‍රහකත්වයන් උපචිත වියදම් ගිණුමේ දෙවරක් සටහන්වීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් උපචිත වියදම් වැඩියෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| අනුග්‍රාහකත්ව වියදම් | 2,047,500 | ප්‍රචාරණ කටයුතු යටතේ වූ අනුග්‍රාහකත්ව වියදම් ලෙස උපචිත වියදම් යටතේ ඉදිරියට ගෙන එමින් පැවති රු.10,072,500 ක උපචිත වියදම්වලින් 2018 වර්ෂයට අදාල වූ රු.2,047,500 කවියදම් සනාථ කිරීම සඳහා අදාල අනුග්‍රාහකත්ව ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර හා නාමලේඛන විගණනයට ඉදිරිපත් නොවීය. | 2018 වර්ෂයට අදාළ වූ වියදම් සඳහා සාක්ෂි ප්‍රචාරණ අංශය සතුව පවතී. | සත්‍ය ලෙස ඉදිරිපත් වූ සාක්ෂි අනුව ගෙවිය යුතු වියදම් හඳුනාගෙන ගිණුම්ගත කිරීම. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මණ්ඩලය විසින් ණය පදනම මත අලෙවි නියෝජිතයන්ට 2013වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නිකුත් කර තිබූ ලොතරැයි අලෙවි කුටි වෙනුවෙන් අයවිය යුතු රු.6,083,363 ක් ද අලෙවි නියෝජිතයින් 45 කට ලබාදී තිබූ පාපැදි වෙනුවෙන් 2016 වර්ෂයට හා ඊට පෙර සිට අයවිය යුතු රු.362,638 ක්ද වශයෙන් එකතුව රු.6,446,001 ක් වූ වාරික මුදල් අයකර ගැනීමට විධිමත් ක්රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. 2018 වර්ෂයේ දී නොගෙවා රඳවාගත් අලෙවි නියෝජිත දිරි දීමනා සහ විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් වලින් රඳවාගත් රු.ලක්ෂ 30 ක මුදල් ද මෙම වසර තුළ ගැලපීමට කටයුතු කරනු ලැබේ. | වාරික මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීමටත් රඳවාගත් මුදල් විධිමත් අනුමැතීන් මත ගැලපීම් කිරීමටත්. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයේදී මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති අලෙවි නියෝජිතයින් 91 දෙනෙකුගෙන් 31 දෙනෙකු පමණක් ඇප බැඳුම්කර තබා තිබුණි. නියමිත ඇප සීමාව ඉක්මවා රු.19,819,533 ක් ද ඇප බැඳුම්කර රහිත අලෙවි නියෝජිතයින් 89 කට රු.139,282,243 ක් ද වශයෙන් ක්ෂණික ලොතරැයිපත් ද නිකුත් කර තිබුණි. ණය අයකර ගැනීමේ දුර්වලතා මත 2016 වර්ෂයේදී අලෙවි නියෝජිතයින් 29 කට ණයට අලෙවි කළ රු.23,365,438 ක් වූ ක්ෂණික ලොතරැයිපත් වෙනුවෙන් අයවිය යුතු මුදල් 2019 මැයි 31 දින වන විටත් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බැංකු ඇපකර තැබිය හැකි මූල්‍ය ශක්තියක් ඇති දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් සංඛ්‍යාව සීමා සහිත වීමත්,ක්ෂණික ලොතරැයිපත් අලෙවියට නියෝජිතයින් ලබා දෙන ප්‍රමුඛතාවය අඩු නිසා දැඩි මූල්‍ය පාලනයක් පවත්වා ගැනීමට අපහසු වී ඇත. මෙම තත්වය තුළ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කරන ලද ණය ප්‍රතිපත්තියට අනුගත වෙමින් තීරණය කරන ලද ණය සීමා යටතේ ක්ෂණික ලොතරැයිපත් ලබා දීම සිදු කරමින් පවති. අයවිය යුතු ශුද්ධ මුදල රු.මිලියන 13.9 ක් වේ. | ඇප බැඳුම්කර ලබාගැනීම හානි වැරදි මූල්‍ය පාලනයකින් කටයුතු කිරීම. |
| (ඇ) 2007වර්ෂයේ දී මණ්ඩලයේ සේවකයන් දෙදෙනෙකුට රු.1,003,038 ක් වටිනා ලොතරැයිපත් ණයට නිකුත්කර තිබුණි.2019ජුනි30දින වනවිටත් ඔවුන්ගෙන්එම මුදල අයවී නොතිබුණි. වර්තමානයේදී එක් නිලධාරියකු සක්‍රීය සේවයේද නොමැති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය. | එක් අයකු සම්බන්ධව නඩුවක් විභාග වෙමින් පවතින අතර එම තීරණය අනුව කටයුතු කිරීමටත් අනෙක් නිලධාරියාගෙන් අයවිය යුතු මුදල අයකිරීමටත් කටයුතු කරනු ලැබේ. | විධිමත් ක්‍රියාමාර්ගයන් අනුව කටයුතු කර ණය මුදල අයකර ගැනීම. |
| (ඈ)මණ්ඩලය විසින් 2013 වර්ෂයේ සිට අදාල වගකීම් නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව උපචිත වියදම් යටතේ වෙන්කර තිබූ එකතුව රු.9,085,823 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මණ්ඩලය විසින් අදාළ ආයතනවලින් ලබා ගන්නා ලද සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල් මෙම උපචිත ශේෂයෙන් දැක්වේ. මෙහි Gamini Arts Advertising Servicesආයතනයට ගෙවිය යුතු මුදල සම්බන්ධ නීතිමය ගැටළුවක් නිසා තවම ගෙවා නොමැත. | සේවානිමකල ආයතනවලට ගෙවීම් කිරීම. |
| (ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එකතුව රු.212,276,805 ක් වූ වෙළඳ ණයගැති ශේෂ තුළ කලම්බු එයාර්පොට් සුපිරි ලොතරැයිය වෙනුවෙන් රු.4,728,146 ක්ද සහ අලෙවි නියෝජිතයන්ගෙන් වර්ෂ 3කට වැඩි කාලයක සිට අයවිය යුතු රු.30,983,156 ක්ද පැවති අතර අලෙවි නියෝජිත ශේෂ තුළ මියගිය අලෙවි නියෝජිතයන් | ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතින අතර මියගිය දෙදෙනාගේරු.559,300.00 ක් වූ ණය මුදල කපා හැරීමට මුදල් අමාත්‍යාංශ අනුමැතියට යොමු කර ඇත. | විධිමත් ක්‍රියාමාර්ගයන් අනුව කටයුතු කර ණය අයකර ගැනීම. |

| | | |
|---|---|---|
| දෙදෙනකුගෙන් අයවිය යුතු රු.559,300 ක්ද විය. මෙම වටිනාකම් සම්බන්ධ අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණි. | | |
| (ඊ) 2016 වර්ෂයේදී මණ්ඩලයවිසින් සුභසාධක සංගමයට අලෙවි කලරු.1,567,992 ක් වටිනා ලොතරැයිපත් වෙනුවෙන්ද මණ්ඩලයෙන් සුභසාධක සංගමය මැදිහත් කරගෙන ආයතනයේ කලාප කළමනාකරුවන් 04 දෙනෙකුට ලබාදී තිබුරු.2,011,363 ක් වටිනා ක්ෂණික ලොතරැයිපත් වෙනුවෙන්ද වු ශේෂයන් නිරවුල් කිරිමට විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි. | 2017අයවැය යෝජනා අනුව ලොතරැයි සඳහා සෙස් බද්දක් පැනවීමෙන් මණ්ඩලයේ පැවැති ක්‍ෂණික ලොතරැයි තොග සම්බන්ධයෙන් ඇතිවන අහිතකර තත්වය සලකාමණ්ඩලයේ ක්ෂේත්‍ර නිළධාරීන්ට ද ලොතරැයි තොග ලබා දෙන ලදී. ඔවුන්ගෙන් එක් නියෝජිතයෙකුට එරෙහිව පොලිස් පැමිණිල්ලක් ද යොමු කර ඇති අතර සේවය හැරගොස් ඇති එක් අයකු හා තවත් නිළධාරීන් දෙදෙනෙකුගේ දිරි දීමනා ගෙවීම් අත් හිටුවා ඇත. ඔවුන්ගෙන් හිඟ මුදල් කොටසක් අයකර ඉතිරි මුදල් අයකර ගැනීම වෙනුවෙන් ගත හැකි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කර බව දන්වා සිටිමි. | - එම - |
| (උ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති වෙනත් ණය ශේෂ තුල වර්ෂ 8 කට වඩා පැරණි රු.1,317,614 ක්වු ණය ශේෂයක් පැවති අතර ඒ තුළ අක්‍රීය අලෙවි නියෝජිතයන් 71 දෙනෙකුට ගෙවිය යුතු රු.2,637,199 ක් හා ලැබිය යුතු රු.566,146 ක් වු අතර ඒවා නිරවුල් කිරිමටද කටයුතු කර නොතිබුණි. | දිගු කාලයක සිට පවතින ශේෂ අමාත්‍යාංශ අනුමැතියෙන් පසුව ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කරනු ඇත. | විධිමත් ක්‍රියාමාර්ගයන් අනුව නිරවුල් කිරිමට කටයුතු කිරිම. |
| (ඌ) 2016 වර්ෂයට පෙර සිට පැවත එන හදුනානොගත් රු.3,585,823 ක බැර ශේෂයක්ද වර්ෂ 08 කට වැඩි කාලයක සිට ණය හිමියන් 04 දෙනකුට ගෙවිය යුතු රු.15,543,973 ක්ද කාර්ය මණ්ඩලයේ 14 දෙනකුට ගෙවිය යුතු රු.213,112 ක මුදලක්ද වශයෙන් පැවති ණයහිමි ශේෂ නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් නොවු ශේෂයන් දෙක ගිණුම්වලින් ඉවත් කිරීමට මුදල් අමාත්‍යාංශ අනුමැතියට යොමු කර ඇත. | විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන අදාල ශේෂයන් නිරවුල් කිරීම. |
| (එ) 2003 වර්ෂයේදි මියගිය හා වැඩ තහනමට ලක්වු නිලධාරින් දෙදෙනකුට ගෙවිය යුතු රු.240,983 ක් වු දිරිදීමනා මුදල්ද, වර්ෂ 08 කට | එක් අයෙකු සම්බන්ධ නඩුවක් විභාග වෙමින් පවතින අතර අනෙක් නිලධාරියාගේ හිමිකම් ඉල්ලුම්කරුවන් නොමැත.ගෙවිය යුතු ශේෂයන් දෙක | විධිමත් පරිදි සොයා බලා ශේෂයන් නිරවුල් කිරීම. |

| | | |
|---|---|---|
| | පෙර දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන්ගෙන් පරිගණක වාරික වෙනුවෙන් ලැබී තිබූ රු.256,952 ක මුදල් ද, වැඩිපුර ලද පරිගණක වාරිකද නිරවුල් කිරිමකින් තොරව පැවතුණි. | ගිණුම්වලින් ඉවත් කිරීමට මුදල් අමාත්‍යාංශ අනුමැතියට යොමු කර ඇත. |
| (ඒ) | ආපසු ගෙවන තැන්පතු ලෙස මණ්ඩලය අයකරගෙන තිබූ රු.7,611,611 ක මුදල 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාලව ලැබී තිබුණි. අදාල සේවාවන් ලබාගෙන තිබුනද එම ආයතන වෙත ඒවා නිරවුල් කර නොතිබූ අතර නියෝජිතයන් විසින් තැන්පතු ලෙස ආයතනයට ගෙවීම් කල රු.107,953 ක මුදල්ද, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | මෙම ගෙවිය යුතු ශේෂයන් ගිණුම්වලින් ඉවත් කිරීමට මුදල් අමාත්‍යාංශ අනුමැතියට යොමු කර ඇත. - එම - |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනත** | | | |
| (i) 14 (2) හා 16(1) හා 16(4) වගන්ති | මණ්ඩලය විසින් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අධිකාර වෙනුවෙන් ලොතරැයි පැවැත්වීමේදී අදාළ ආයතන සමග ගිවිසුමකට එළඹිය යුතුය. එහෙත්, ගොවිසෙත, සුපිරි වාසනා, ජාතික සම්පත, නීරෝගා හා සෙවණ ලොතරැයි වෙනුවෙන් අදාළ ආයතන සමග ගිවිසුම්ගතවීමකින් තොරව සමාලෝචිතවර්ෂයේදී රු.5,204,004,004ක් ත්‍යාග ලෙස පිරිනමා තිබුණි. එසේ ගිවිසුම් ගත වීමකින් තොරව ලොතරැයි පැවැත්වීම හේතුවෙන් ජයග්‍රාහකයින් විසින් හිමිකම් නොපෑ ත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලයේ අභිමතය පරිදි කටයුතු කර තිබුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ. | 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ ලොතරැයි පැවැත්වීමයි. ඒ අනුව ලොතරැයි පැවැත්වීමේදී වෙනත් කිසිඳු ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹීමේ අවශ්‍යතාවයක් නොමැත.<br>1998 අංක (22) දරණ මුදල් (සංශෝධිත) පනතින් (7.2.1**A**) ත්‍යාග පිරිනැමීම සඳහායොදා ගැනීමට ත්‍යාග සංචිත අරමුදලක් ගොඩනැඟීමයි. තවද, විශේෂ දිනුම් වාරයන්හි අතිරේක ත්‍යාග සඳහාද මෙම අරමුදල භාවිතා කරනු ලබයි. එවැනි තත්වයක් තුල පනත මඟින් ලබා දී ඇති ප්‍රතිපාදන තුල මේ සඳහා අමාත්‍යාංශ අනුමැතියන් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවන බව පෙන්වා දෙමි. | පනතේ දක්වා ඇති පරිදි කටයුතු කිරිම. |

| | | | | |
|---|---|---|---|---|
| | | • ජයග්‍රාහකයින් 06 දෙනෙකු විසින් හිමිකම් නොපෑ ගුවන් ටිකට්පත්වල වටිනාකම වූ රු.2,306,400 ක මුදල තෑග සංචිත අරමුදලට බැරකිරීම. | විදේශ සංචාර ජයග්‍රාහකයින් විසින් මුදල් ඉල්ලා සිටීමත්, එම තෑග ලබා ගැනීමේදී සිදුවූ ප්‍රසම්පාදන අපහසුතා හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් එම තෑග වෙනුවට මුදල් තෑග ලබා දෙන ලදී. තෑග ලබා ගැනීමට ඉදිරිපත් නොවූ ජයග්‍රාහකයින්ගේ තෑග මුදල් වටිනාකම නැවත තෑග සංචිත අරමුදලට බැර කරන ලදී. | - එම - |
| | | • මාස 06 ඉක්ම වන ලද රු.12,762,192 ක් වූ හිමිකම් නොපෑ මුදල්මය නොවන ද්‍රව්‍යමය තෑග සම්බන්ධයෙන් විධිමත් පියවරක් අනුගමනය කර නොතිබීම. | ජයග්‍රාහකයින් ඉදිරිපත් නොවූ තෑග භාණ්ඩ මුදල් තෑග මෙන් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා පවතින අතර බොහෝවිට එම තෑග පිරිවැය ලබා ගනු ලබන මූලාශ්‍රය වනුයේ තෑග සංචිත අරමුදල වේ. | - එම - |
| | | • එකතුව රු.10,850,000 ක් වූ හිමිකම් නොපෑ වාහන දෙකක් මණ්ඩලයේ පරිහරණය සඳහා යොදාගෙන තිබීම. | 2013වර්ෂයේ මිලදී ගත් ජීප් රථය අඛණ්ඩව ප්‍රදර්ශනාගාර සඳහා යොදාගැනීම හේතුවෙන් බාහිර පෙනුම තෑග සඳහා ලබා දීමට සුදුසු නොවීම, 2016 වර්ෂයේදී මිලදී ගත් වෑන් රථය ජයග්‍රාහකයකු බිහි වී අදාල තෑග ලබා ගැනීමට ඉදිරිපත් නොවීම සහ ඊළඟ දිනුම් ඇදීමේදි ජයග්‍රාහකයකු බිහි නොවීම යන කරුණු හේතුවෙන් නැවත වරක් තෑග ලෙස යොදා ගැනීම පාරිභෝගිකයින් අතර ඍණ ආකල්ප වර්ධනය වීමට ඉවහල් විය හැක.ආයතනයේ අවශ්‍යතාවය මතඅධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියෙන් වාහන සංචිතයටඇතුලත් කරන ලදී. | - එම - |
| (ii) | 17(2) වගන්තිය | ලොතරැයි ආදායමින් අදාළ වියදම් අඩුකළ පසු ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් ඉකුත් වර්ෂවලට අදාළව එසේ බැර කිරීමෙන් තොරව රු.523,075,433 ක් රඳවා තබාගෙන තිබුණි. | ලාභය ඒකාබද්ධ අරමුදලට බැර කළහොත් ආයතනය උග්‍ර මුදල් අර්බුදයකට මුහුණ දීමට සිදුවන හෙයින් ආයතනය පවත්වා ගැනීමට නොහැකි වනු ඇත. සමුච්චිත ලාභයෙහි පෙන්නුම් කරනුයේ ආයතනයේ වත්කම් සහ වගකීම් ඇතුළත වන හෙයින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට හැකියාවක් නොමැත. | පනත අනුව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (iii) 20(1)(2) වගන්තිය | මණ්ඩලය විසින් ලොතරැයි පැවැත්වීම සම්බන්ධයෙන් රීති සකස්කර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවද 2013 වර්ෂයේ සිට හඳුන්වාදී තිබූ නව ලොතරැයි වන මෙගා පවර්, නීරෝගා, සුපිරි දෙලක්ෂපති, ධන නිධානය හා සෙවණ යනාදි ලොතරැයි සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලොතරැයිවලට අදාලව සකස් කල රීති සහ සියලුම ලොතරැයිවල වෙනස්කම් නිති සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කර ඇත. ලොතරැයි ත්‍යාග රටා, දිනුම්වාර සහ දිනුම් අදිනු ලබන දිනයන් ආදිසංශෝධන සෑම අවස්ථාවකදීම ගැසට් පත්‍රයේ පළ කිරීම ප්‍රායෝගික නොවන බව මුදල් අමාත්‍යාංශය නිරීක්ෂණය කර ඇත."ජාතික ලොතරැයි මණ්ඩල පනත" නමින් නව පනතක්, මුදල් පනතින් වෙන්ව සැකසිමට කැබිනට් අනුමැතියද ලබා දී ඇති අතර, එම පනත සැකසීමේදී නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවද ලොතරැයි ත්‍යාග රටා වෙනස්වීම් ගැසට් පත්‍රයේ පළකිරීම ප්‍රායෝගික නොවන බව සැලකිල්ලට ගෙන ඇත. | ලොතරැයි පැවැත්වීමට අදාල රීති ලොතරැයි මිලදී ගනු ලබන පාර්ශවයන්ට විධිමත්ව ගැසට් නිවේදන මගින් දැනුම් දීම අප්‍රමාදව සිදු කිරිම. |
| **(ආ)2009 අංක 8 දරණ මොටර් රථ වාහන (සංශෝධිත) පනතේ 2 (අ)(1)(ඌ) වගන්තිය** | මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී රු.20,750,000 ක් වැයකර මිලදීගත් සිංගල් කැබ් රථ 06ක බඳ කොටසඩබල් කැබ් රථයක් ලෙස මතුපිටින් පෙනෙන ලෙස නවීකරණයට රු.1,625,000 ක් වැයකර තිබුණද ඒ සඳහා විධිමත් පරිදි මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කැබ්රථවලසිදුකර ඇත්තේ බඳ වෙන් කිරීමක් නොව පිටුපස සඳහා නවීනව සැලසුම් කරන ලද Fiber Canopyයක් සවිකිරීම පමණකි. විශේෂත්වය වනුයේ මෙහි ඉදිරිපස හා පසුපස එකිනෙකසම්බන්ධවීම පමණකි.<br>තවද, මෙහි ආසනසංඛ්‍යාව හෝවෙනත් බඳෙහි ප්‍රධාන වෙනස් කිරීමක් සිදුකර නොමැති බැවින් මෝටර්රථ කොමසාරිස් ජනරාල්ගේ අවසරය ලබා ගැනීමට අවශ්‍යතාවයක් පැන නොනැඟිණි.<br>කෙසේ වුවත් එසේ අවශ්‍ය වන්නේ නම්, ඉදිරියේදී මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත පෙන්වා එම අවසරය ගැනීමට කටයුතු කරන බැව්ද දන්වමි. | නවීකරණය සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කිරිම. |

**(ඇ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| (i) Viii වන පරිච්ඡේදයේ 10.1 ඡේදය හා 10.2 ඡේදය | සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දිනවල රාජකාරීවල නිරත වීම වෙනුවෙන් පැය 08 කට නොඅඩු එක් දිනක් සඳහා වැටුපෙන් 1/20 ක දීමනාවක් ලබාදිය හැකි වුවද එම විධිවිධාන නොසලකා දිනකට පැය 12 ඉක්මවා රාජකාරී ඉටුකරන සෑම එක් දිනක්ම දින දෙකක් රාජකාරී කළ සේ සලකා ගෙවීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එසේ දින දෙකක් සේ සැලකූ අවස්ථා 60ක් වෙනුවෙන් ගෙවා තිබූ මුදල රු.184,000 ක් විය. තවද, සතියේ වැඩ කරන දිනයන්ද රජයේ නිවාඩු දිනයන් සේ සලකා නිවාඩු දින වැටුප් ගෙවා තිබූ අවස්ථා 40 ක් නිරීක්ෂණය වූ අතර එසේ ගෙවා තිබූ මුදල රු.68,706 ක් විය. | නව ලොතරැයි වෙළඳපොලට හඳුන්වාදීම, දිනකට ලොතරැයි දිනුම් ඇදීමේ අවස්ථා 04 ක් සිදු කිරීම, සතියේ දින 07 තුළම ලොතරැයි දිනුම් ඇදීම් සිදු කිරීම හා වසරේ දින 360 කට කාලයක් කාර්යාලය විවෘත තැබීම යන කරුණු නිසා කාර්ය මණ්ඩලයේ වැඩි පිරිසකට සති අන්ත හා රජයේ නිවාඩු දින රාජකාරි කිරීමට සිදුව ඇත. මෙම කරුණු පිළිබඳව සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවීම් කරනු ලබයි. | ආයතන සංග්‍රහයේ පවත්නා නීති රීති අනුව අදාල අනුමැතින් ලබා ගැනීම. |
| (ii) xxivපරිච්ඡේද යේ 11 වන වගන්තිය සහ 2018 ජනවාරි 23 PE/LO/NLB/COPE/2018 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපිය | 2005 ජනවාරි 01 දින සිට දේපල ණය ලබා දීම බැංකු මගින් පමණක් සිදු කළ යුතු අතර ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින්ද අවධාරණය කර තිබුණි. එම විධිවිධාන පිළිබඳ නොසලකා සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 13 න් දෙනෙකු වෙත රු.18,183,883 ක මුදලක් දේපල ණය ලෙස මණ්ඩලයේ මුදල් උපයෝගී කර ගෙන ලබාදී තිබුණි. එසේම දේපල ණයසඳහාවිධිවිධාන ප්‍රකාරවනිලධාරියාගෙන්අය කරගත යුතු පොළිය නොසලකා සෑම නිලධාරියෙකුටම සියයට 4 ක අවම පොළී අනුපාතය යටතේ ණය ලබා දී තිබුණි. | 1995 වර්ෂයේ සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් සේවක සුභසාධනය සැලසීමේ අරමුණින් සියයට 4 ක පොළිය මත නිවාස ණය ලබා දීම සිදු කරයි. යම් හේතුවක් මත ණය මුදල නියමිත දිනට පෙර පියවීමට සිදු වුවහොත් ඒ සඳහා සියයට 18 ක පොළියක් ගෙවා ණය මුදල පියවා දැමීමට කටයුතු කරනු ලැබේ. | භාණ්ඩාගාර උපදෙස් අනුව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (iii) xxiv පරිච්ඡේදය | අනුමත විධිමත් බඳවා ගැනීමේ පරිපාටියට සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන නොසලකා මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවිකරණ/ ප්‍රවර්ධන තනතුර සඳහා අයකු බඳවාගෙන 2018 ඔක්තෝබර් 01 දින සිට මේ දක්වා වැටුප් හා දීමනා ගෙවමින් පැවතුණි. | උපදෙස් පතා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇති අතර ඒ අනුව ඉදිරියේදී නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | අනුමත බඳවාගැනීම් පරිපාටිය අනුගමනය කර අදාල බඳවාගැනීම් සිදු කිරිම. |
| **(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි ,(1)103 (4)104,(3)104 ,සහ 1642 | 2017 හා 2018 වර්ෂයන් තුලදී මණ්ඩලය සතු වාහන සඳහා සිදු වී තිබූ අනතුරු 16 ක් සම්බන්ධ විධිමත් පරීක්ෂණයන් පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි. එසේම අනතුරු සම්බන්ධයෙන් ලඟම ඇති පොලිසියට ද වාර්තා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට මේ වනවිටත් කටයුතු යොදා ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරිම. |
| (ii) මුදල් රෙගුලාසි 702 **(3)** | කොන්ත්‍රාත් ගිවිසුම් පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ලොතරැයි මුද්‍රණය, ප්‍රචාරණය හා භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් වූ ගිවිසුම් සඳහා එසේ කටයුතු කර නොතිබුණි. | අවශ්‍යතාවය අනුව ඉදිරියේදී කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් විගණකාධිපතිවරයා වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරිම**.** |
| (iii) මුදල් රෙගුලාසි ,754,756 හා 757,758 770 | විධිවිධාන ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු පවත්වා නොතිබුණි. | 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී මෙම කරුණු සැලකිල්ලට ගැනීමට උපදෙස් ලබා දී ඇත. | - එම - |
| **(ඉ)2011 පෙබරවාරි 9 දිනැති අංක 13/2008** (iv) **දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2015 මැයි 25 දිනැති අංක 01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | (i) නිල වාහන සඳහා හිමිකම ඇති නිලධාරින් 04 දෙනෙකු වෙනුවෙන් මාසිකව ලබාදිය හැකි ඉන්ධන දීමනා සීමාව ඉක්මවා රු.1,402,219 ක් වැඩිපුර ගෙවා තිබුණි. | 2008මැයි 29 දින මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී ලබාදුන් උපදෙස් මත 2008 ජුනි 02 වන දින පවත්වන ලද විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී දැනට ක්‍රියාත්මක වන දීමනාව අනුමත කර ඇත**.** | මුදල් අමාත්‍යාංශ අනුමැතිය ලිඛිතව අනුමත කරවා ගැනීමට කටයුතු කිරිම. |

| | | | |
|---|---|---|---|
| | (ii) නිල වාහන හිමිකම් නොමැති කලාප කළමනාකරුවන් 24 ක් සහ අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් 17 ක් සඳහා ඉන්ධන දීමනාවක් සහ තමාගේ පුද්ගලික වාහනය භාවිතා කරන්නේ නම් අතිරේක මාසිකව දීමනාවක් ද ලෙස නිලධාරීන්ගේ වැටුපට එකතු කර සමාලෝචිත වර්ෂය තුළදී රු.5,237,409 ක දීමනා ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් කලාප කළමනාකරුවකුට මාසිකව රු.25,000 ක උපරිමයකට හා අලෙවි ප්‍රවර්ධන නිලධාරියෙකුට මාසිකව ඉන්ධන ලීටර් 25 ක උපරිමයකට යටත්ව රාජකාරී අවශ්‍යතාවයන් වෙනුවෙන් පමණක් ධාවනය කර ඇති කිලෝ මීටර් ප්‍රමාණය ගණනය කර ඉන්ධන දීමනාව ලබාදෙයි. | - එම - |
| **(ඊ)** රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | | | |
| **(i)** 02 ජුනි 2003 දිනැති අංක 12/පීඊඩීදරන චක්‍රලේඛය | | | |
| • 8.3.9ඡේදය | මණ්ඩලය සතු සම්පත් රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් රාජ්‍ය ආයතන සඳහා ලබා නොදිය යුතු වුවද ඊට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන් 05 දෙනෙකු සහ රු.11,276,786 ක් වටිනා මෝටර් වාහන 03 ක් මුදල් අමාත්‍යාංශය සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස සිට මුදා හැර තිබුණි. තවද,එම නිලධාරීන්ට2018 වර්ෂයේදී මණ්ඩලයෙන් ගෙවා තිබූ සේවක පාරිශ්‍රමික හා දිරි දීමනා මුදල වූ රු.1,800,323 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීම හා නිර්දේශයන් පරිදි කොන්ත්‍රාත් පදනමට මණ්ඩලයට බඳවාගත් නිලධාරීන් 05 දෙනෙකු මුදල් අමාත්‍යාංශයට අනුයුක්ත කොට ඇත. ඔවුන්ගේ රාජකාරීන්සඳහා වැටුප්හාදීමනාලබාදීමඅමාත්‍යාංශයේඅයීක්ෂණය යටතේ සිදු කරයි. ඔවුන්ට ගෙවන වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීමක් සිදු නොකෙරේ. | ගෙවනු ලබන වැටුප් හා දීමනා මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම. |
| • 9.12 ඡේදය | (i) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2006 වර්ෂයේ මණ්ඩලය විසින් අසරණ සරණ අරමුදල නමින් අරමුදලක් ආරම්භ කර ඒ සඳහා ලොතරැයි ත්‍යාග ලාභීන්ගෙන් ලද පරිත්‍යාගසහ "නීරෝගා" ලොතරැයි අලෙවි ආදායමෙන් සියයට 0.5 ක ප්‍රතිශතය එම අරමුදලට බැර කර | අසරණසරණඅරමුදලටත්‍යාගලාභීන් විසින් සියකැමැත්තෙන්කරනුලබනපරිත්‍යාගයන් වනඅතරඑමගින් අසරණ වූ අයට ආධාර කරනු ලබයි. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදලෙහි රු.14,016,057 ක ශේෂයක් පැවතුණි. | | |
| | (ii) මණ්ඩලයේ සභාපතිනියගේ අනුමැතිය මත කාර්ය මණ්ඩලය සඳහා රු.19,129,643 ක සුභසාධක දීමනාවක් ගෙවා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම දීමනාව ඉකුත් වර්ෂවලදීද ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම දීමනාව සෑම වසරකම අප්‍රේල් මස සිංහල අවුරුද්ද සහ නත්තල් උත්සවය පදනම් කර ගෙන ගෙවනු ලබන දීමනාවකි. | - එම - |
| **(ii)** 1994 ජුනි 14 දිනැති අංක 95 දරණ චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ චක්‍රලේඛය | (i) භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ දිරිදීමනා ලෙස එසේ ගෙවා ඇති මුදල රු.97,228,123 ක් විය. | 2004 වසරේදී ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවති සාකච්ඡා මත ලබා දුන් අනුමැතිය මත ගෙවීම් කරනු ලබයි. | - එම - |
| | (ii) රජයේ අනුමත සංයුක්ත දීමනාව වෙනුවට එක් දිනකට උපරිම ලෙස රු.3,000 දක්වා වූ විශේෂ ප්‍රවර්ධන දීමනාවක් කාර්ය මණ්ඩලයට ලබාගත හැකි වන පරිදි විධිවිධාන සලසා තිබුණද ඒ සඳහා නිශ්චිත අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී එසේ ගෙවා ඇති මුදල රු.4,910,750 ක් විය. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් විශේෂ ප්‍රවර්ධන හා විශේෂ රාජකාරී සඳහා දීමනා ගෙවීම කරනු ලැබේ. | - එම - |
| (iii) 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී/03/2015ද රණ චක්‍රලේඛයේ ඡේදය 2.5 | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂක වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.343,486ක දිරිදීමනාවක් ගෙවා තිබුණි. | රජයේ ආදායම වැඩි කරලීමට අමාත්‍යාංශය ලබාදෙන ඉහළ ආදායම් ඉලක්ක ලබා ගැනීම සඳහා වෙළඳපොල තරඟකාරිත්වයට මුහුණ දීමේදී ක්ෂණික තීරණ ගැනීම්, විවිධ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, විවිධ රැස්වීම් පැවැත්වීම හා ඒවාට සහභාගිත්වය මෙන්මලොතරැයි දිනුම් ඇදීමේ සමස්ත ක්‍රියාවලියේ අධීක්ෂණ වගකීම වැනි සියළු කාර්යයන් සිදු කිරීමේදී සභාපතිගේ හා ක්‍රියාකාරී අධ්‍යක්ෂගේ උපදෙස්, මඟපෙන්වීම සහ නොමසුරු දායකත්වය ඉතාමත් අවශ්‍ය වේ.<br>එසේම, දෛනිකව ආයතනයේ කටයුතුවලට සහායවීම, සියළුම | - එම - |

| | | | |
|---|---|---|---|
| | | ලිපිලේඛන වලට අත්සන් තැබීම, රැස්වීම් සඳහා සහභාගීවීම ආදී භාරදූර කාර්යයන් රැසක් ඉටු කරන බැවින්, ඔවුන්ට දිරිදීමනා ගෙවීම සාධාරණීකරණය කල හැකි සේම එය ආයතනයට ඉතාමත් ඵලදායී බවද නිරීක්ෂණය කරමි. | |
| (iv) 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන රාජ්‍ය ව්‍යාපාරචක්‍ර ලේඛය | මණ්ඩලය විසින් වාර්ෂික ප්‍රචාරණ සැලැස්මක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී ප්‍රචාරණ වියදම් වශයෙන් රු.1,023,507,765 ක් ගෙවා තිබූ අතර ඉකුත් වර්ෂයේදීද එසේ ගෙවා තිබුණු මුදල රු.940,272,567 ක් විය. | අලෙවිකරණ අංශයේ ප්‍රචාරණ අයවැය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන අනතුරුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමුකිරීම සිදු කර ඇත. | අදාල අනුමැතින් ලබා ගැනීමට කටයුතු කිරිම. |
| **(උ)1993 ජනවාරි 21 දිනැති අංක** PE1**/70/7/**Vo**11 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය** | රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලු ලොතරැයිවලින් ලැබෙන ආදායමෙන් සියයට 16.5 ක ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කල යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී පවත්වා තිබූ මෙගාපවර් හා ධනනිධානය යන ලොතරැයි වර්ග 02 ක ආදායමින් සියයට 10 වටිනාකමක් පමණක් ප්‍රේෂණය කිරීම නිසා තවදුරටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකළ වටිනාකම රු.200,901,108 ක් විය. | ආරම්භයේ පටන් මහජන සම්පත හා වාසනා සම්පත යන ලොතරැයි දෙකින් පමණක් සියයට 16.5 ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන අතර පසුව ආරම්භ කරන ලද ඉතිරි ලොතරැයි සියයට 10 ක ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කර ගෙන යන ලදී. | භාණ්ඩාගාර උපදෙස් පරිදි නියමිත ප්‍රේෂණයන් සිදු කිරිම. |

**1.8 මුදල් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** ........................... | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** .............................................. | **නිර්දේශය** ................ |
|---|---|---|
| මණ්ඩලීය රැස්කිරිමේ ගිණුමට අලෙවි නියෝජිතයින් විසින් මුදල් තැන්පත් කිරිමේදී බැංකුව විසින් සියයට 0.50 සේවා ගාස්තුවක් අයකර තිබුණි. එම ගාස්තු ගණනය පිළිබඳ තොරතුරු මණ්ඩලය සතු නොවූ අතර ඒ සඳහා ලිඛිත ගිවිසුමක් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ද ඉදිරිපත් නොවුණි. 2018 වර්ෂය වෙනුවෙන් බැංකුව අයකළ ගාස්තුව රු.41,591,442 ක් වූ අතර පසුගිය වර්ෂ 05 තුළදී එසේ ගෙවා තිබූ ගාස්තුව රු.171,443,373 ක් විය. මෙම ගාස්තුව අඩුකර ගැනීම සම්බන්ධ කිසිදු ක්‍රියාමාර්ගයක් මණ්ඩලය විසින් ගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | මණ්ඩලීය රැස්කිරීමේ ගිණුමට කරනු ලබන තැන්පතු සඳහා දැනට පවතින බැංකු ගාස්තු ප්‍රතිශතය සියයට 0.50 සිට සියයට 0.45 දක්වා අඩුකිරිමට පියවරගෙන ඇත. ඊ-මේල් තැන්පතු සම්බන්ධ කටයුතු බැංකුවෙන් ඉවත්කර මණ්ඩලය විසින් සිදුකරනු ලබයි. | බැංකු ගාස්තු අවම කර ගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් යෙදීම. |

## 1.9 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් එහි ගිණුම් කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් 2003 වර්ෂයේදී හඳුන්වා දී තිබූ මධ්‍යගත පරිගණක මෘදුකාංගය 2016 වර්ෂයේදී විමධ්‍යගත කර තිබීම හේතුවෙන් එම මෘදුකාංගයෙන් ලබාගත හැකි සේවාවන් සීමිත වී තිබුණි. කලින් පැවති මධ්‍යගත ක්‍රමය මගින් ආයතනයේ ගනුදෙනු පිළිබඳව පැවති විශ්වාසනීයත්වයද මෙම විමධ්‍යගත ක්‍රමය යටතේ ප්‍රශ්නගත වී තිබුණු අතර, අදාළ වෙනස් කිරීම් නිසා ඇතිවන අවදානම්වල වගකීම භාර ගැනීම මෙම මෘදුකාංගය හඳුන්වාදුන් සමාගමද ප්‍රතික්ෂේප කර තිබුණි. | මධ්‍යගත Sage Accpacපරිගණක මෘදුකාංගය භාවිතා කිරීමේදී සිදුවූ ණයහිමි පාලක ගිණුමේ ශේෂයක් දැනටමත් ප්‍රධාන ජ'නලයේ ඉතිරිවී ඇත. මෙවැනි ගනුදෙනු සිදු වීම ඉදිරියේදී වළක්වා ගැනීම සඳහා Accpac පද්ධතියට අලුතින් එකතු කරන ලද පරිගණක මෘදුකාංගයන් ප්‍රධාන ජර්නලයෙන් ඉවත් කර වෙන් වෙන් වශයෙන් මෘදුකාංගයන් ලෙස දැනට භාවිතා කරයි. විමධ්‍යගත කරන ලද පරිගණක පද්ධතිය හේතුවෙන් වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව පවත්වගෙන යෑමට හැකිවී තිබේ. | මෘදුකාංග සතු ගුණාංගආරක්ෂා වන පරිදි පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරිම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේමෙහෙයුම් ප්‍රතිඵලය රු.136,267,795 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.139,805,208 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.276,073,003 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී නිරීක්ෂණය වූයේ සමාලෝචිත වර්ෂයේදී එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 197 කින් පිරිහී ඇති බවයි. කෙසේ වුවද මෙම මූල්‍ය ප්‍රතිඵලයට, සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2014 වර්ෂයේ සහ 2017 වර්ෂයේ දායකත්වයේ අඩුවීමක්ද 2015, 2016 සහ 2018 වර්ෂවල වර්ධනයක්ද නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
| --- | --- | --- | --- | --- | --- |
| | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) |
| බදු පසු ශුද්ධ ලාභය (ලාභාංශ ගෙවීමට පෙර) | (136,267,795) | 139,805,208 | 414,761,431 | 241,016,039 | (8,663,584) |
| සේවක පාරිශ්‍රමික | 420,862,040 | 375,410,032 | 380,279,707 | 320,462,652 | 267,215,394 |
| රජයට ගෙවූ බදු | | | | | |
| ආදායම් බදු | 1,174,402,368 | 484,610,312 | 482,128,237 | 669,785,229 | 117,853,496 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 286,551,044 | 235,767,246 | 285,776,997 | 253,267,754 | 211,761,787 |
| එකතු කළ අගය මත බදු | 890,352,095 | 742,298,500 | 706,868,280 | 573,252,862 | 540,502,194 |
| ඒකාබද්ධ අරමුදලට සිදු කළ දායකත්වය | 2,426,947,888 | 2,016,986,336 | 2,445,594,544 | 2,130,953,970 | 1,888,455,133 |
| ක්ෂය වීම | | | | | |
| මෝටර් රථ ක්ෂය වීම් | 19,290,936 | 55,627,510 | 54,979,532 | 48,727,716 | 33,000,569 |
| අනෙකුත් ක්ෂය වීම් | 60,229,778 | 70,474,209 | 68,497,174 | 60,061,990 | 26,090,623 |
| | 5,142,368,354 | 4,120,979,353 | 4,838,885,902 | 4,297,528,212 | 3,076,215,612 |

## 2.2. ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී වාසනා සම්පත ලොතරැයියේ ආදායම සියයට 48 කින් අඩුවන විට ප්‍රචාරණ වියදම අඩුවී තිබුණේ සියයට 30 ක් පමණි. සුපිරි වාසනා ලොතරැයි ආදායම සියයට 6 කින් අඩුවන විට එහි ප්‍රචාරණ වියදම සියයට 9 කින් ඉහළ ගොස් තිබුණි. | තරගකාරි වෙළෙඳපොල තුල සන්නාමය රැක ගැනීමට භාවිතා කරන ක්‍රමෝපායන් වේ. වෙළඳපොල හැසිරීම අනුව ගනු ලබන තීරණ වේ. | ලොතරැයි අලෙවියට නව උපක්‍රම භාවිතා කිරීම. |
| (ii) රු.මිලියන 4,885 ක ඉහලම ආදායමක් උපයා ඇති මහජන සම්පත ලොතරැයියේ ප්‍රචාරණ පිරිවැය විකුණුම් ආදායමින් සියයට 2.9 ක් ලෙස පහලම අගයක් ගෙන තිබුණද රු.මිලියන 1,162 ක ආදායමක් උපයා ඇති සම්පත් රේඛා ලොතරැයියේ ප්‍රචාරණ පිරිවැය විකුණුම් ආදායමින් සියයට 8 ක ඉහළ අගයක් ගෙන තිබුණි. | සම්පත් රේඛා සතියකට එක් වතාවක් පමණක් අලෙවි කල ලොතරැයියක් වන අතර වෙළෙඳපොල ආරක්ෂා කර ගැනීමට ප්‍රචාරණ වියදක් දැරීමට සිදු වී ඇත. | ලොතරැයියක පැවැත්ම මූලිකව සලකා බලා ප්‍රචාරණ වියදම් සැලසුම් කිරීම. |
| (iii) සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබූ දිනුම් වාර සංඛ්‍යාව හා ප්‍රදානය කළ සුපිරි ත්‍යාග හා අනෙකුත් මුදල් ත්‍යාග ව්‍යුහය සැලකිල්ලට ගත් විට රු 2000.ට වඩා අඩු ත්‍යාග ලාභීන්ගේ ප්‍රතිශතය සියයට කට 99 .වැඩි අගයක් ගෙන තිබුණි | සුපිරි ත්‍යාගය ප්‍රථම ත්‍යාගය හැරුනු විට අනෙකුත් ත්‍යාග ස්ථර සකස් කර ඇත්තේ කුඩා ප්‍රමාණයේ ජයග්‍රාහකයන් ඉහල අගයක් ගන්නා පරිද්දෙනි. ජයග්‍රාහකයන් වැඩි කිරීම මගින් ඔවුන් තවදුරටත් ඒ හරහා ලොතරැයි මිලදී ගැනීමට පෙළඹවීමත් තමා යම් මට්ටමක ජයග්‍රාහකයෙක් සේ ඒත්තුගැන්වීම් මගින් ලොතරැයි කෙරෙහි ඇතිවන සෘණාත්මක බලපෑම අවම කිරීම. | ත්‍යාගලාභීන් වැඩි පිරිසකට උපරිම ත්‍යාග මුදලක් තීරණය කිරීම. |

## **2**.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ ලාභදායීත්ව හා කාරක ප්‍රාග්ධන අනුපාත පිළිබඳවිග්‍රහයක් පහත දැක්වේ.

| අනුපාතය | වර්ෂය 2018 | 2017 |
|---|---|---|
| (i)දළ ලාභ (ප්‍රතිශතය) | 13.04 | 12.36 |
| (ii)ශුද්ධ ලාභ/(අලාභ) (ප්‍රතිශතය) | (0.67) | 0.83 |
| (iii)ජංගම වත්කම් අනුපාතය | 1.75:1 | 1.65:1 |
| (iv)ක්ෂණික වත්කම් අනුපාතය | 1.73:1 | 1.61:1 |

මණ්ඩලයේ ජංගම හා ක්ෂණික අනුපාත ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට තවදුරටත් අවධානය යොමුවිය යුතු අතර සමාලෝචිත වර්ෂයේ ක්ෂණික අනුපාතය 1.73:1ක් ලෙස පෙන්නුම් කරනු ලැබුවද ත්‍යාග සංචිත අරමුදල හා සේවක පාරිතෝෂික අරමුදල ජංගම වත්කම්හි ආයෝජනය කර තිබීම මත එම අනුපාතය ලැබී ඇති බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 අනාර්ථික ගනුදෙනු

---------------------------

| විගණන නිරීක්ෂණය<br>............................. | කළමනාකාරීත්වයේඅදහස් දැක්වීම<br>................................................. | නිර්දේශය<br>............... |
|---|---|---|
| (අ)ආයතනයේ නෛතික සේවාවක් සඳහා තනතුරක් ඇතිකර ඒ සඳහා නීති නිලධාරියෙකු බඳවාගෙන සිටියද මණ්ඩලයේ විවිධ නීති සේවා ප්‍රසම්පාදනයකින් තොරව බාහිර නීතිඥ ආයතන මගින් සිදුකරවා ගෙන තිබුණි. තවද අදාල නීති සේවාවන් නීතිපති දෙපාර්තමේන්තුව මගින්ද ලබාගැනීමේ හැකියාව පිළිබඳ සොයා බලා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එසේ ලබාගත් නීති සේවාව වෙනුවෙන් රු.2,189,109 ක් වැයකර තිබුණි. තවද කොළඹ වාණිජ මහාධිකරණයේ විභාග වන නඩුවක එක් එක් නඩුවාරය සඳහා නීතිඥ මහත්වරුන් තිදෙනෙකු බැගින් යොදවා නඩුවාර 05 ක් සඳහා ගෙවා ඇති නීතිඥ ගාස්තුව රු.471,750 ක් විය. | ජාතික ලොතරැයි මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති) විසින් ගිවිසුම් පිළියෙල කිරීම, මණ්ඩලය පාර්ශවයක් වන නඩු කටයුතු සඳහා මූලික කරුණු ගොනුකිරීම හා ඒ සම්බන්ධ නිරීක්ෂණ (Observation)ඇතුළු මූලික කටයුතු සිදු කර නීතිපති දෙපාර්තමේන්තුව හෝ ජාතික ලොතරැයි මණ්ඩලයේ ලියාපදිංචි නීතිඥ මණ්ඩලයේ (Panel of Lawyers) නීතිඥවරුන් සම්බන්ධීකරණය, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ විගණන කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කිරීම සඳහාය. නීති සේවාවන් ලබා ගෙන ඇත්තේ නීතිපති දෙපාර්තමේන්තුවෙන් සහ ජාතික ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කර ඇති නීතිඥ මණ්ඩලයේ (Panel of Lawyers) නීතිඥයින්ගෙන් පමණි.<br>තවද නඩු අංක HC/CIVIL/262/MRදරන කොළඹ වාණිජ මහාධිකරණයේ විභාග වන නඩුව වෙනුවෙන් ලේඛනගත නීතිඥවරයකු සහ ජනාධිපති නීතිඥවරයකු පෙනී සිටින අතර, ජනාධිපති නීතිඥවරයකු අධිකරණයේ පෙනී සිටීමේදී කණිෂ්ඨ නීතිඥවරයකු සමග පෙනී සිටීම අනිවාර්ය වේ. | නීතිපතිවරයා විමසා පෞද්ගලික නීතිඥයින්ගේ සහාය ලබා ගැනීම සුදුසු වේ. |
| (ආ) නිර්මාණාත්මක ප්‍රචාරණ නියෝජිත ආයතන විසින් නිෂ්පාදනය හා සංස්කරණය නිමකර මණ්ඩලයට ඉදිරිපත් කරන ප්‍රචාරණ දැන්වීමට අදාල සියළුම ගෙවීම් කිරීමෙන් පසුව ද, එම දැන්වීම් අදාල මාධ්‍යයන්වල ප්‍රචාරණය වන සෑම වාරයක්පාසාම එම ප්‍රචාරණ ආයතනයට | ප්‍රසම්පාදනක්‍රමවේදයන් මගින් බඳවා ගැනීම සිදු කරන අතර එම ආයතන සමග ගිවිස ගැනීම් අලෙවිකරණ අංශය මගින් සිදු නොකරන අතර අදාල ගිවිසුමට අනුව එම ආයතන සමග ගනුදෙනු කිරීම් සිදු කරනු ලබයි. | මණ්ඩලය විසින්ම සන්නිවේදන කාලය වෙන්කර ගනිමින් අදාල කටයුතු සිදු කිරීම. |

| | | |
|---|---|---|
| මුළු සේවා ගාස්තුවෙන් සියයට 11.5 ක් අනාර්ථිකව ගෙවීම් කරමින් පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළදී රු.36,724,054 ක් එලෙස ගෙවා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| (ඇ)ජාතික ලොතරැයි මණ්ඩලයේ දෛනික ලොතරැයි දිනුම් ඇදීම් රූපවාහිනිය විකාශනය කිරීම සඳහා අතරමැදි ආයතන ලෙස ප්‍රචාරණ සමාගම්වල සහාය ලබාගත් බවට වාර්තා කර ඒ සඳහා සියයට 15 ක සේවා ගාස්තුවක් ප්‍රචාරණ ආයතනවලට ගෙවා තිබුණි. එහෙත් එවැනි සහායකින් තොරව දැනට පවත්වනු ලබන සෙවණ ලොතරැයිය සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය යොදාගැනීම තුලින් 2018 වර්ෂයේදී පමණක් රු.5,738,357 ක් ඉතිරි කර ගැනීමට හැකිව තිබුණි. එහෙත් අනෙකුත් ලොතරැයි 10 ක් වෙනුවෙන් එසේ කටයුතු නොකර එම කටයුතු ප්‍රචාරණ නියෝජිතායතන මගින් ලබාගත් බව වාර්තා කරමින් රු.65,256,074 ක් අනාර්ථික ලෙස වැය කර තිබුණි. | සියලුම ලොතරැයි සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව තෝරා ගනු ලැබූ නියෝජිත ආයතන සඳහා ජාතික රූපවාහිනිය මගින් එම ආයතන සඳහා සියයට 15 ක සේවා ගාස්තුවක් ගෙවනු ලබයි. මෙම ගෙවීම් සඳහන් මණ්ඩලය මැදිහත් විමත් සිදු නොවන අතර සෙවණ ලොතරැයිය සඳහා පමණක් නියෝජිත ආයතනයක් නොමැති බැවින් එම සේවා ගාස්තුව අඩු කොට රූපවාහිනී ආයතනය සඳහා ගෙවීම් කිරීමට කටයුතු යොදා ඇත. | - එම - |
| (ඇ) සරල අයදුම්පතක් ඉදිරිපත් කිරීම මගින් මණ්ඩලය විසින් පවත්වනු ලබන ලොතරැයි සඳහා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය මගින් සිදුකරන සන්නාමයන් ලියාපදිංචිය ඍජුවම කරවා ගැනීමට හැකියාව තිබියදී ඒසඳහා බාහිර නීතිඥ සමාගම් යොදාගෙන සමාලෝචිත වර්ෂය තුළදී එම සමාගම් සඳහා රු.296,305 ක මුදලක් අනාර්ථික ලෙස ගෙවා තිබුණි. | වෙළෙඳ ලකුණ ලියා පදිංචිය සම්බන්ධයෙන් ලොතරැයි නාම ලියාපදිංචියේදී කාණ්ඩ අනුව සිදු කිරීමත් ගැසට් නිවේදනයට විරෝධතා ඉදිරිපත් වීමත් සිදුවේ. එහිදි නිතිඥයකුගේ සේවාව අවශ්‍යවේ. | අයදුම්පත භාරදීමේදී ඒ සඳහා විරෝධතා තිබේනම් අදාල නෛතික කටයුතු සඳහා යොමුවීම ප්‍රමාණවත් වේ. |

**3.2** හඳුනාගත් පාඩු

-------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 32 වන කලම්බු එයාර්පෝට් සුපර් ඩ්‍රෝ ලොතරැයියේ දිනුම් ඇදීමේදි අවලංගු කරන ලද රු.627,750 ක් වටිනා අස්ථානගත වූ ලොතරැයිපත් 135 ක් වූ අතර ඒ තුල පුද්ගලික ප්‍රචාරණ ආයතනය මගින් අස්ථානගත කල ලොතරැයිපත් 66 ක්ද, මණ්ඩලයේ ප්‍රචාරණ අංශයේ කාර්ය මණ්ඩලය මගින් අස්ථානගත කල ලොතරැයිපත් 69 ක් ද විය. ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා එම මුදල් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම ලොතරැයිපත් 135 ම නොවිකුණූ ටිකට්පත් සේ සලකා දිනුම් වාරය ක්‍රියාත්මක කර ඇති අතර සාධාරණ කාලයක් තුල එම ටිකට්පත් හිමිකරුවන් වේ නම් මණ්ඩලයට දැනුම්දීමට අවස්ථාව උදාවන පරිදි ප්‍රධාන පුවත්පත් 03ක භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රචාරණය කිරීමට තීරණය කරන ලදී. | ලොතරැයිපත් අස්ථානගත වීම පිළිබඳ මූලික පරීක්ෂණයක් පවත්වා ඒ අනුව කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| (ආ) 2018 වර්ෂය තුලදී මණ්ඩලය සතු අංක 227-0217 දරන ලොරි රථයේ රු.451,605 ක් වැයකර නිර්මාණය කල වෙළෙඳ ප්‍රචාරණ ආකෘතියක් වෙනත් ට්‍රක් රථයක ගැටීමෙන් එම ආකෘතියට හානි වී තිබූ අතර එම අලාභය අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනතුර සිදුවන අවස්ථාව වනවිටත්මෙය සකසා වසර 2 ක් පමණවූ අතර නැවත සකස් කල යුතු තත්වයේ විය. ඒ සඳහා විශාල වියදමක් දැරිය යුතු බැවින් හා අලෙවි කටයුතු වලදී වඩාත් අපහසු බැවින් එහි නිවාස ආකෘතිය ඉවත්කර ඒ වෙනුවට නවීනව මිලදී ගන්නා ලද කැබ් රථයක කුඩා නිවාස ආකෘතියක් සෑදීමට කටයුතු සැලසුම් කර තිබුණි. | හානි වූ දේපල සම්බන්ධ මූලික පරීක්ෂණ පවත්වා අලාභ පියවාගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) 2012 වර්ෂයේදී රු.825,000 ක් වැයකොට මිලදීගෙන තිබූ අංක PS-2354 දරන වාහනය 2018 ජූනි 12 දින හදිසි අනතුරකට පත්වීම හේතුවෙන් එම වාහනය ගර්හිත කිරීමට සිදුවන බව රක්ෂකයා මණ්ඩලයට දැනුම් දී ලබාදීමට එකඟ වූ රක්ෂණ හිමිකම් රු.600,000ක් විය. | 2012 වසරේදී රු. 825,000 ක මුදලකට මිලදී ගත් PS-2354වාහනය යුනයිටඩ් මෝටර්ස් ආයතනය විසින් එම අළුත්වැඩියාවට මුළු ඇස්තමේන්තු වියදම ලෙස රු.402,610 ක් ඉදිරිපත් කර ඇත. නමුත් රක්‍ෂණ සමාගම එය අළුත්වැඩියා කිරීම වෙනුවට රු.600,000 ක මුදලකට වාහනය ගර්හිත කිරීමට එකඟ වී ඇත. ඒ අනුව මේ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කිරීම සඳහා මේ වනවිට කමිටුවක් පත්කර ඇත. | සුදුසු නිර්දේශයන් නොපමාව ක්‍රියා කිරීම. |
| (ඇ) ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවයට බඳවාගෙන මුදල් අමාත්‍යාංශයට නිදහස් කර ඇති සම්බන්ධීකරණ නිලධාරියකු වෙත රාජකාරි කටයුතු සඳහා ලබාදී තිබූ KV-0392දරන වාහනය මණ්ඩලයට නොදන්වා 2018 අප්‍රේල් 12 දින එම නිලධාරියාගේ පෞද්ගලික ගමනක් සඳහා භාවිතා කිරීමේදී අනතුරකට පත් වී තිබුණි. එම වාහනය අළුත්වැඩියා කිරීම සඳහා රු.538,650 ක පිරිවැයක් දැරීමට සිදුව තිබුණද ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | රක්‍ෂණයෙන් සම්පූර්ණ මුදලම එනම් රු. 538,650 ක් මුදලක් ලැබී තිබුණි. ඒ අනුව අනතුර හේතුවෙන් මණ්ඩලයට කිසිඳු අලාභයක් සිදුවී නොමැත. සිද්ධිය සම්බන්ධයෙන් මු.රෙ 104(3) යටතේ ප්‍රාරම්භක වාර්ථාව යොමු කර ඇත. තවද සිද්ධිය සම්බන්ධයෙන් මාතර පොලිස් ස්ථානය වෙත වාර්ථා කර ඇති අතර ලැබී ඇති සාක්ෂි අනුව මෙය වාහනයේ රියදුරු වරදින් සිදුවූවක් නොවන බැව්ද පෙන්වා දෙමි. | පෞද්ගලික ගමන් සඳහා රාජකාරි වාහන යොදා ගැනීම පිළිබඳව කටයුතු කිරීම. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂවලදී වැඩිපුර ගෙවනලද රු.7,392,287 ක සේවක පාරිතෝෂික මුදල නැවත මණ්ඩලයට අයකරගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2013 මාර්තු 21 දින නියෝග කර තිබුණද එම මුදල අය කර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට හෝ කටයුතු කර නොතිබුණි. වැඩිපුර ගෙවා | 2010 සිට 2012 දක්වාවූ වසර දෙකක කාලය තුළදී එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයකට අනුව එක් මසක මූලික පඩිය පාරිතෝෂිත මුදල ලෙස ගෙවා ඇත. මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන්ද උපදෙස් ලබා ගත් අතර එම මුදල් අය කර ගැනීම ප්‍රායෝගික නොවන බැවින්, ජාතික | පොදු ව්‍යාපාර කාරක සභාව විසින් ලබාදුන් තිරණ අනුව කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| ඇති පාරිතෝෂික මුදල මණ්ඩලයට ප්‍රතිපූර්ණය කරන ලෙස අදාළ විශ්‍රාමික නිලධාරීන්ට ලිඛිතව දැන්වීම පමණක් මණ්ඩලය විසින් සිදු කර තිබුණි. | ලොතරැයි මණ්ඩලයේ පාලන අංශය විසින් 2018 ජුනි 29 දින අංක 3810(19) වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම මුදල පොත් වලින් කපා හැරීමට තීරණය කර මුදල් අමාත්‍යාංශයේ අනුමැතියටයොමු කර ඇත. | |
| (ආ) 2014 නොවැම්බර් 04 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී ලබාදී තිබූ නියෝගය අනුව, මණ්ඩලය සතු චොක්ෂෝල් වීදියේ පිහිටි පර්චස් 112 ක ඉඩමේ නව ගොඩනැගිල්ලක් ඉදිකළ යුතු විය. එහෙත් 2016 වර්ෂය අවසාන වන විටද ගොඩනැගිල්ලේ සැලසුම් කටයුතු සඳහා ගෘහ නිර්මාණ ශිල්පියෙකු තෝරා ගැනීම පමණක් සිදුකර තිබුණි. මෙම ඉදිකිරීම 2019 මැයි 31 දක්වා ආරම්භ කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ කාර්යාල හා ගබඩා කටයුතු පවත්වාගෙන යාමට ලබාගෙන තිබුණ ගොඩනැගිල්ල වෙනුවෙන් මාසිකව රු.9,336,994 ක් වැට් බදු සහිතව ගෙවමින් පැවතුණි. | උපදේශන සේවා ආයතනය විසින් එකඟ වූ පරිදි ලංසු ලේඛන පිළියෙල කිරීමේ කාර්යය දක්වා වූ වැඩ කොටස් අවසන් කර ඇතත් අනුමත ගොඩනැගිල්ල ඉදිකිරීමේ ඇස්තමේන්තුව ඉක්මවා යාම මත නව ඇස්තමේන්තුව සඳහා නැවතත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ ඇස්තමේන්තුව ඉහළ යාමට හේතු දක්වමින් වාර්තාවක් ලබා දෙන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව විසින් උපදේශන ආයතනය වෙත උපදෙස් ලබා දී ඇත. ඒ අනුව නව ඇස්තමේන්තුව සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් 2018 මාර්තු 21 වන දින යොමු කර ඇත.<br><br>තවද මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2018අප්‍රේල් 03 දිනැති ලිපිය මඟින් දැනට රජයේ පවතින ප්‍රතිපත්ති අනුව නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අවසර ලබා දිය නොහැකි බව අප වෙත දන්වා එවා ඇත. | රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව සංශෝධිත ඇස්තමේන්තු මත ඉදිකිරීම් සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ඒ අනුව කටයුතු කිරීම. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දී ජංගම ප්‍රචාරණ රථ 21 ක් සඳහා රියදුරු හා ප්‍රචාරක නිලධාරියකු බැගින් යොදවා රු.158,125,880 ක් වටිනා ලොතරැයිපත් අලෙවි කර තිබුණි. එම අලෙවියන් මත සියයට 17.5 ක විකුණුම් කොමිස් ලෙස රු.27,672,029 ක මුදලක් කිසිදු ලේඛනගත සාක්ෂියකින් තොරව එම කාර්යයේ නියුතු නිලධාරීන් වෙත ලබාදී තිබුණි. අදාල අංශයේ කාර්යභාරය, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් ස්ථාපිත වී නොතිබුණි. | ජංගම ප්‍රචාරක අංශයේ සහ විශේෂ අලෙවි සහ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සම්බන්ධ වන කාර්ය මණ්ඩලය විසින් අලෙවියට ලබාගන්නා ලොතරැයිපත් සඳහා රු.16.50 බැගින් පියවීම් කර ඉතිරිවන කොමිස් මුදල ඔවුන්ට ලේඛනගත කර ලබාදීමසිදු නොකෙරේ.එහි කාර්යභාරය පිළිබඳව විශේෂයෙන් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබා ගෙන නොමැති අතර, එසේ ලබා ගැනීමේ අවශ්‍යතාවයක්ද නොමැති බව අපගේ හැඟීමයි. | මණ්ඩලය විසින් ගෙවන කොමිස් මුදල් භාරදීම හා භාරගැනීම පිළිබඳව ලේඛන පැවැත්වීම. |

| | | |
|---|---|---|
| (ආ) කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන විවිධ අරමුදල් 04 ක් විගණනය කිරීම සඳහා පෞද්ගලික විගණකවරුන් වෙත සමාලෝචිත වර්ෂයේ දී රු.119,000 ක් ද ඉකුත් වර්ෂයේ දී රු.235,000 ක් ද වශයෙන් එකතුවරු.354,000 ක් මණ්ඩලයේ අරමුදලින් දරා තිබුණි. මෙම විගණන ගාස්තු අදාල අරමුදලින් නොගෙවා මණ්ඩලයේ අරමුදලින් ගෙවීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි. | ආරම්භයේ සිට මේ දක්වාම විගණන ගාස්තුව මණ්ඩලය මගින් දරා ඇත. මේ සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | භාණ්ඩාගාර අනුමැතින් අනුව ගෙවීම් කිරිම. |
| (ඇ)මණ්ඩලයේලියාපදිංචි අලෙවි නියෝජිතයින්ගෙන් ඇප බැඳුම්කර ලබා ගැනීමේ අවශ්‍යතාවය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවධාරණය කර තිබුණද ඒ සඳහා ක්‍රියානොකර 2016ජුලි සිට 2017 ජුලි දක්වා කාලයට රු.8,290,055 ක අමතර පිරිවැයක් මණ්ඩලය විසින් දරා ණයවර රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණි. ඒ සඳහා 2016, 2017 වර්ෂ වෙනුවෙන් නොගෙවා ඇති රු.23,365,438 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබු බව විගණනයේ දී නිරීක්ෂණය විය. | ණය ශේෂයන් අයකර ගැනීමට දුරකථන මගින් සිහිකැඳවීම් සිදු කිරීම, පැරණි ශේෂයන් සහිත අලෙවි නියෝජිතයින්ට ලබාදෙන විශේෂ දිනුම් වාර ලොතරැයිපත් ණය පදනම මත ලබානොදීම, සේවා ගාස්තු නිදහස් නොකර රඳවා තබාගැනීම සහ එමගින් කොටස් වශයෙන් ණය අයකර ගැනීම ආදී ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, මේ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාර නොදක්වන නියෝජිතයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද කටයුතු කරමින් පවතී. | රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක කාලපරිච්ඡේදයට අදාල හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කිරිම. |
| (ඈ) 2017 වර්ෂයේ දී ප්‍රසම්පාදන කටයුතු සිදුකළ රු.6,110,000 ක් වටිනා මහජන ඇමතුම් 650 න් මහජන ඇමතුම් 180 ක් 2019 මැයි 31 දින වන විටත් බෙදා නොහැර ගබඩාවේ පැවතිණි. 2018 වර්ෂය අවසානය වන විටද එම භාණ්ඩවල ගුණාත්මකභාවය, කල්පැවැත්ම හා නියෝජිතයන්ට ඒවායේ අවශ්‍යතාවය යනාදිය පිළිබඳ විධිමත් අධ්‍යනයක් සිදු කර ඇති බවක්ද නිරීක්ෂණය නොවීය. | මහජන ඇමතුම් පද්ධති 169 ක් ගබඩාවේ ඉතිරිව පවතින අතර, එම ප්‍රමාණය විශේෂ දිනුම් වාරයන්හි අලෙවි ඉලක්ක ලබාගැනීම, අලෙවි නියෝජිත සම්මන්ත්‍රණවලදී කාර්යසාධනය මත පදනම්ව අලෙවි නියෝජිතයින් දිරිගැන්වීම වෙනුවෙන් යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍යතාහඳුනාගැනීමෙන් භාණ්ඩ මිලදී ගැනීම හා නොපමාව බෙදාහැරිම. |

### 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව සම්පූර්ණයෙන්ම පැවරී නොතිබියදී මණ්ඩලය විසින් එහි නිලධාරියෙකුට රු.624,780 ක නිවාස ණය මුදලක් ලබාදී තිබු අතර එම නිලධාරියා 2017 ජුනි 17 දින සේවය හැරගොස් තිබුණි.එහෙත් පසුව අදාළ දේපලේ භුක්තිය නැවත ඉල්ලා එම පාර්ශවය විසින් උසාවියේ නඩුවක් පවරා තිබු අතර එහි පාර්ශවකරුවෙකු ලෙස | මව සහ තම පුත්‍රයා (ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවකයා) අතර ඉඩමේ භුක්තිය සම්බන්ධයෙන් මෙම නඩුවේ විභාගය අවසන් වී තීන්දුව ප්‍රකාශ කිරීමට නියමිතව ඇති අතර, ගරු අධිකරණය විසින් දෙනු ලබන තීන්දුවෙන් අනතුරුව ඉදිරි තීරණ ගැනීමට බලාපොරොත්තුවේ. | දේපල ණය මුදල හා අදාල නිතිඥ ගාස්තුව අයකර ගැනීමට කටයුතු කිරිම. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලය නම්කර තිබුණි. මණ්ඩලය තුල වෘත්තීය සුදුසුකම් ලත් නීතිඥයෙකු සිටියදී මෙම නඩුවේ නඩුවාර 12 ක් සඳහා මණ්ඩලය විසින් රු.263,975 ක් ගෙවා බාහිර නීතිඥයන් යොදවා ගෙන තිබුණි. | | |
| (ආ) | 2016 වර්ෂයේදී නියෝජිතයන් වෙත බිල්පත් නිකුත්කර විකුණුම් ආදායමට බැර කර තිබූ රු.4,298,410ක්වටිනා ක්ෂණික ලොතරැයිපත් සමාලෝචිත වර්ෂයේදී ආපසු එවා තිබුණි. එහෙත් 2016 වර්ෂයේදී සමස්ත විකුණුම් පදනම් කරගෙන කාර්ය මණ්ඩලයට සහ නියෝජිතයන්ට රු.35,813,250 ක දිරි දීමනා ගෙවා තිබූ අතර එම වටිනාකම් ගැලපීම් කිරීමටද කටයුතු කර නොතිබුණි. | 2016 වර්ෂයේදී ණය පදනම මත අලෙවි කළ ක්ෂණික ලොතරැයිපත් ආපසු ලබා ගැනීමට 2017 වර්ෂයේදී කටයුතු කරන ලද බැවින් එම ටිකට්පත්වල වටිනාකම ආපසු එවුම් වශයෙන් ගිණුම්ගත කිරීමේ හැකියාවක් නොමැත. | උපලබ්ධි නොවූ ලොතරැයිපත් සඳහා විකුණුම් කොමිස් සහ දීමනා නැවත ගැලපීමට කටයුතු කිරීම. |
| (ඇ) | 2018 මාර්තු 07 දින මහනුවර දිස්ත්‍රික්කයේ පැවති අයහපත් කළහාකාරී තත්ත්වය මත එම දිස්ත්‍රික්කයේ නියෝජිතයින් වෙත දිනුම්වාර 04 ක් වෙනුවෙන් නිකුත්කළ සම්පූර්ණ ලොතරැයිපත් 264,000 ම නොවිකුණු සේ සලකා අදාල දිනුම්වාරවලින් ඉවත් කර තිබුණි. එම නියෝජිතයින් විසින් ඒ වන විට අලෙවිකර තිබූ සියලු ලොතරැයිපත් ද ඇතුලුව සියලුම ටිකට්පත් අවලංගු කිරීමකට ලක්කිරීම සම්බන්ධව මුදල් අමාත්‍යාංශ අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය. | 2018මාර්තු07දී මහනුවර දිස්ත්‍රික්කයේ ඇතිවූ හදිසි තත්වය තුළ දිනුම් ඇදීමට නියමිත ලොතරැයිපත් දිනුම් ඇදීමට ඉදිරිපත් නොකිරීමටත් එය මණ්ඩලය විසින් ආපසු ලබාගත් ලොතරැයිපත් ලෙස සැලකීමටත් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත තීරණය කරන ලදී. එවැනි ව්‍යාපාරික තීරණ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය නොවන බව අපගේ හැඟීමයි. | නොවිකුණු ලොතරැයිපත් ප්‍රමාණය හඳුනාගෙන ඒ සඳහා මුදල් අමාත්‍යාංශය අනුමැතිය මත කටයුතු කිරීම. |
| (ඈ) | 2018 සැප්තැම්බර් 28 දින දිනුම් අදින ලද ගොවිසෙත 1896 දිනුම්වාරයේදී නොවිකුණු ලොතරැයිපත් 8,000 ක් 2018 සැප්තැම්බර් 20 දින ජාතික ලොතරැයි මණ්ඩලයේ ගබඩා අංශයට අදාල දිස්ත්‍රික් අලෙවි නියෝජිතට භාර දී තිබියදීත් ඒ සඳහා ඉන්වොයිසි නිකුත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණය විකුණුම් ලෙස සලකා කටයුතු කර තිබුණි. එම හේතුවෙන් අලෙවි නියෝජිතයා වෙත නැවත ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් සහ නියමිත රාජකාරි ඉටු නොකිරීමට අදාල නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් 2019 ජුනි 10 වන විටත් සිදුකර නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. | මෙම ලොතරැයිපත් 8000 ආපසු භාරදීමට අදාලව ලොතරැයි ඇණවුම් අංශය වෙත හෝ ලොතරැයි ආපසු භාරගැනීමේ අංශය වෙත හෝ ලිඛිත සනාථ කිරීමක් එම ලොතරැයිවාරය දිනුම් අදිනු ලැබූ දින එනම් 2018 සැප්තැම්බර් 28 වන දින විටත් ලබා දී නොමැති බව අදාලඅංශ භාර නිලධාරීන් සහතික කර ඇත.මේ සම්බන්ධයෙන් ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් පූර්ණ සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත. | ලොතරැයිපත් නැවත භාරගැනීමේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය නිවැරදිව කිරීම. |

| | | |
|---|---|---|
| (ඉ)2018 සැප්තැම්බර් 28 දින දිනුම් ඇදීමට නියමිත ධන නිධානය 55 වන දිනුම්වාරයේ ලොතරැයිපත් 900 ක් සහ මෙගා පවර් 285 වන දිනුම්වාරයේ ලොතරැයිපත් 500 ක් අදාල දිස්ත්‍රික් අලෙවි නියෝජිත වෙත ප්‍රවාහනයේ දී අස්ථානගත වීම හේතුවෙන් එම ලොතරැයිපත් සියල්ල අදාල දිනුම් වාරයේ දී නොවිකුණු සේ සලකා ඉවත් කිරීම පමණක් සිදුකර තිබුණි. එහෙත් ඒ සම්බන්ධ විධිමත් පරීක්ෂාවක් සිදුකර අදාල අලාභයන් ගණනය කර ගිණුම් තැබීම සිදුකර නොතිබුණි. | කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව මෙම ලොතරැයිපත් වර්ග 02ට අදාල බාර්කෝඩ් පරාසයට ඇතුළත් ලොතරැයිපත් ප්‍රමාණයන් 2018 සැප්තැම්බර් 28 වන දිනට දිනුම් ඇදීමට නියමිත අදාල ලොතරැයි දිනුම්වාරයන්ගෙන් ඉවත් කරන ලදී. | අස්ථානගතවීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව මූලික පරීක්ෂණයන් සිදු කර අදාල ක්‍රියාමාර්ගයන් ගැනීම. |
| (ඊ) 2000 අගෝස්තු 23 දින සිට සේවය හැර ගොස් ඇති මණ්ඩලයෙන් දේපල ණය ලබාගත් නිලධාරියෙකුගෙන් එදිනට අයවිය යුතු මුදල රු.340,275 ක් වී තිබුණි. එම ණය අයකර ගැනීමට 2019 ජුනි 30 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2000 අගෝස්තු 23 වන දින සේවය හැර ගියද මෙම නිලධාරියාට අයත් දේපල ණය පියවා ගැනීමට එවකට සිටි පාලන තන්ත්‍රය ක්‍රියානොකර ඇත්තේ මෙම දේපල ණය මුදල ඔහුගේ අර්ථ සාධක අරමුදලෙන් පියවා ගත හැකි බැවිනි. 2018 නොවැම්බර් 27 වන දින ඔහු විසින් මණ්ඩලයට අයවිය යුතු සියළුම ණය අය කර ඉතිරි අර්ථ සාධක අරමුදල දෙන ලෙස ලිඛිතව ඉල්ලා ඇත. ඒ අනුව දේපල ණය අය කර ඉතිරි අර්ථ සාධක අරමුදල ගෙවීම සඳහා සියළුම කටයුතු නිම කර ඇත. | ණය ශේෂයන් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කිරීම. |

**3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය සතු අංක BMW 5860 මෝටර් රථය නිෂ්ක්‍රීයව පැවතුණි. | සභාපතිනිය විසින් තම රාජකාරි කටයුතු සඳහා යොදා ගනු ලබන අතර මෙම වාහනය අනාර්ථික නොවන ආකාරයට ධාවනයට යොදවනු ලැබේ. | සුදුසු පරිදි ධාවනයේ යෙදවීම. |
| (ආ) 2010 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.1,000,000 ක් වටිනා ලොතරැයි දිනුම් ඇදීමේ යන්ත්‍රයක් සඳහා මණ්ඩලය විසින් තවදුරටත් රු.329,693 ක අළුත්වැඩියාවක් දරා තිබුණද මේ වන තෙක් එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙම දිනුම් ඇදීමේ යන්ත්‍රයෙ ඉංග්‍රීසි අකුර දකුණු පැත්තේ නිරූපණය වන අතර එය වෙනස් කිරීම සඳහා විශාල මුදලක් වැයවන හෙයින් එය වෙනස් කර නොමැත. පවත්නා මහජන සම්පත දිනුම් අදීම් යන්ත්‍රයේ මෘදුකාංග අඩංගු කර ඇති පාලකය (Console) ක්‍රියාවිරහිතවී තිබූ හෙයින් මෙම දිනුම් ඇදීමේ යන්ත්‍රයේ පාලකය (Console) මේ සඳහා භාවිතා කරමින් පවති. එබැවින් එකී යන්ත්‍රය නිෂ්ක්‍රීයව පවතින බව ප්‍රකාශ කළ නොහැක. | නිවැරදි තාක්ෂණික පිරිවිතරයන් අනුව මිලදී ගැනීම. |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මණ්ඩලය විසින් වෙළෙඳපොළට ඉදිරිපත් කර ඇති ක්ෂණික ලොතරැයි වර්ග දෙකක මුද්‍රණ කටයුතු සඳහා වූ ගිවිසුම්ගත කාලය 2015 මැයි 31 න් අවසන් වී තිබුණද 2019 මැයි 31දක්වා නව මුද්‍රණකරුවෙකු තෝරා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ඉටුකර නොතිබුණි. | ක්ෂණික ලොතරැයිපත් මුද්‍රණ කටයුතු වෙනුවෙන් 2016 මාර්තු 29 වන දින කැඳවන ලද ප්‍රසම්පාදනය මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් පෙත්සමක් නිසා අවලංගු කර ඇත. නව ප්‍රසම්පාදන කමිටුව විසින් මිලගණන් කැඳවා ඇගයීම් සිදු කර ලංසුව ප්‍රදානය කිරීම සඳහා 2019 අගෝස්තු 21 වන දින මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා දී තිබියදී මෙම ප්‍රසම්පාදනයට එරෙහිව මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් එක් ලංසුකරුවෙකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරීම මත ඒ අනුව 2019 අගෝස්තු 23 දින නීති උපදෙස් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මෙතෙක් ඒ සඳහා කිසිඳු ප්‍රතිචාරයක් ලැබී නොමැත. | ප්‍රසම්පාදනයන් නියමිත පරිදි සැලසුම් කිරීම. |
| (ආ)සමාලෝචිත වර්ෂයේදී රු.2,400,000 ක් වැයකර මිලදී ගෙන තිබූ සූර්ය පැනල 500 කින් 2019 ජුනි 16 දින වන විටත් සූර්ය පැනල 474 ක තොගයක් ගබඩාවේ පැවතුණි. මෙම ප්‍රසම්පාදනයේදී අවශ්‍යතාවය මෙන්මප්‍රතිලාභීන් ද නිශ්චය කර නොතිබුණි. | අලෙවි කුටි සඳහා විදුලි සම්බන්ධතාවය යම් දුරකට හෝ අවම කිරීම අරමුණු කරගෙන අලෙවි කුටි පවත්වාගෙන යන අලෙවි නියෝජිතයින් ප්‍රතිලාභීන් ලෙස නිශ්චය කර මෙම සූර්ය පැනල මිලදී ගන්නා ලදී. | අවශ්‍යතාවය මතප්‍රසම්පාදනය සිදුකර ඒවා බෙදාහැරීම. |
| (ඇ) 2018 වර්ෂයේදි මණ්ඩලය විසින් ප්‍රවර්ධන අයිතමයන් වර්ග 31 ක් වෙනුවෙන් රු.118,964,725 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද එම වර්ෂය තුලදි ප්‍රසම්පාදන කටයුතු නිමකර තිබුණේ අයිතම 6 ක් සඳහා පමණක් වූ අතර ඒවායේ වටිනාකම රු.21,569,725 ක් විය. | ප්‍රවර්ධන අයිතමයන් 31 ක් ප්‍රසම්පාදන සැලසුමෙහි ඇතුලත් කර ඇතත් වර්ෂය තුලදී ප්‍රවර්ධන අයිතමයන් 15 ක පමණප්‍රසම්පාදන කටයුතු නිමකර ඇත. ප්‍රසම්පාදන සැලසුමෙහි ඇතුලත් කලද අවශ්‍යතාවය මත එනම් තරඟකාරී ආයතනයේ ප්‍රවර්ධන වැඩසටහන්ද සැලකිල්ලට ගෙන අත්‍යාවශ්‍ය භාණ්ඩ පමණක් මිලදී ගැනීම සිදු කරයි. | සැලසුම් කල අවශ්‍යතා මත භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කිරිම. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 වර්ෂයේ දී රු.13,128,900 ක් වටිනා ලොතරැයි අලෙවි කුටි 300 ක් නිෂ්පාදනය කර සැපයීමට 2019 පෙබරවාරි මස ඇනවුම් ලබා දී තිබුණ ද 2019 ජූලි 10 දින වන විටත් සපයා තිබුණු අලෙවි කුටි සංඛ්‍යාව 50 ක් පමණක් විය. අදාල සැපයුම්කරු සමඟ ඒ සඳහා ගිවිසුමකට එළඹී නොතිබූ අතර ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ අලෙවි කුටි 300ක් නිෂ්පාදනය කර බෙදාහැරීමට සැපයුම්කරු අපොහොසත්වීම මත අදාළ ඇප බැඳුම්කරය මඟින්රු.1,509,823.50 ක් වූ මුදල අයකර ගන්නා ලදී. අලෙවි කුටි සැපයීමට ප්‍රමාදවීම හේතුවෙන් සපයා ඇති අලෙවි කුටි සඳහා ඉදිරියේදී ගෙවීම් කිරීමේදීප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | නියමිත පරිදි ප්‍රසම්පාදනය කාල සටහන ක්‍රියාත්මකකිරීම. |
| (ඉ) සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ සියලුම ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර අපේක්ෂිත අලෙවි ප්‍රවර්ධන අයිතමයන් සඳහා පමණක් ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. | 2018 වර්ෂය සඳහා අලෙවි ප්‍රවර්ධන අයිතමයන්ද ඇතුළත්ව සියළුම අපේක්ෂිත ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රසම්පාදන සැලසුමක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. | සියලුම අයිතමයන් ඇතුලත්ව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරිම. |
| (ඊ) 2016 ජූලි මාසයේදී හා 2018 මැයි මාසයන්වලදී ආරම්භ කළ සෙවණ හා ධන නිධානය යන ලොතරැයි 02 හි මුද්‍රණ කටයුතු ප්‍රසම්පාදනයකින් තොරව මුද්‍රණකරුවන් දෙදෙනෙකු වෙත අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් පවරාදී තිබුණි. අදාල මුද්‍රණ කටයුතු සිදු කිරීමේදී ඇති වූ මුද්‍රණ දුර්වලතාවයන් නිසා පසුව එම කටයුතු යලිත් වෙනත් ආයතන දෙකකට පවරා තිබූ බව නිරීක්ෂණය විය. එසේම මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ මෙහෙයවා තිබුණු ලොතරැයි වර්ග 11 කින් ලොතරැයි වර්ග 06 ක් සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව මුද්‍රණකරුවන් තෝරාගෙන තිබුණි. | සෙවණහා ධන නිධානය ලොතරැයිපත් වෙළඳපොලට හඳුන්වා දීමේදී හදිසි අවශ්‍යතාවය, සේවයේ ගුණාත්මක බව සහ කාර්යක්ෂමතාව යන කරුණු පිළිබඳව සලකා බලාදැනට සිටිනමුද්‍රණකරුවකුට කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලදී. ප්‍රසම්පාදන කාලසටහනට අනුව ලංසු ප්‍රදානය සඳහා 2018 ඔක්තෝබර් 31 වන දිනට සැලසුම් කර තිබුණද, එම ලංසු කැඳවීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සමක් විභාග වීම හේතුවෙන් සුදුසුකම් ලැබූ මුද්‍රණකරුවන් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට නොහැකි වී ඇත. පවත්නා මුද්‍රණකරුවන්ගේ කොන්ත්‍රාත් කාලය 2019 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කිරීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී ඇත. | ප්‍රසම්පාදනය අනුවමුද්‍රණකරුවන් පත්කර ගැනීමට කටයුතු කිරිම. |
| (උ) මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන මහජන සම්පත ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2008 වර්ෂයේ සිටද නීරෝගා ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2015 වර්ෂයේ සිටද මෙගාපවර් ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2018 වර්ෂයේ සිටද රාජ්‍ය | මහජන සම්පත ලොතරැයියේ මුද්‍රණ කටයුතු සඳහා රු.මිලියන 05ක බැංකු ඇපකරයක් ඇත. මුද්‍රණ ගිවිසුම අත්සන් කිරීමට කෙටුම්පතක් සකස් කර ඉදිරිපත් කර ඇතත් එම ගිවිසුම අත්සන් කර නැත. නීරෝගා ලොතරැයිය සඳහා ද ලංසු කැඳවීම් | මුද්‍රණකරුවන් සමග ගිවිසුම් ගත වීම හා අදාල බැංකු ඇපකර ලබාගැනීමට කටයුතු කිරිම. |

මුද්‍රණ නීතිගත සංස්ථාව විසින් මේ දක්වා ඉටු කර තිබුණද, ඒ සඳහා ලිඛිත ගිවිසුමක් නොවීය. 2016 වර්ෂය තුළදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් එක් ටිකට්පතක් මුද්‍රණය කිරීම සඳහා ලැබී ඇති අවම මිල රු.0.3570 ක් වුවද රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත මහජන සම්පත, නීරෝගා සහ මෙගාපවර් යන ලොතරැයිපතක මුද්‍රණ පිරිවැය ලෙස රු.0.50231ක් ගෙවමින් පැවතුණි. තරඟකාරී මිල ගණන් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පමණක් මහජන සම්පත ලොතරැයිපත් මුද්‍රණයෙන් සිදුවිය හැකි ඇස්තමේන්තු කළ හැකි අලාභයරු.44,804,393ක්ද, නීරෝගා ලොතරැයිපත් මුද්‍රණයෙන් ඇස්තමේන්තු කළ හැකි අලාභය රු.8,474,222ක්ද සහ මෙගා පවර් ලොතරැයිපත් මුද්‍රණයෙන් ඇස්තමේන්තු කළ හැකි අලාභය රු.17,858,050 ක්ද වශයෙන් පැවතුණි.

කටයුතු සිදු නොකරන ලෙස ජනමාධ්‍ය ඇමතිතුමා විසින් ජාතික ලොතරැයි මණ්ඩලීය සභාපතිතුමිය වෙත කරන ලද ඉල්ලීමකට සුදුසු මුද්‍රණකරුවන් තෝරා ගැනීමට ලංසු කැඳවීම් සිදු නොකරන ලදී. 2018 ජුනි 26 වන දින අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ උපදෙස් පරිදි නීරෝගා හා මෙගා පවර් ඇතුළු දිනුම් අදිනු ලබන ලොතරැයිපත් වර්ග 08 ක් සඳහා එකවිට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, මේ වන විට නව ප්‍රසම්පාදනයේ වැඩ කටයුතු සිදු කරමින් පවතී.

(ඌ)2018 වර්ෂයේ පරිගණකාශ්‍රිත ලොතරැයිපත් මුද්‍රණය සම්බන්ධයෙන් වූ පිරිවිතරයෙහි සඳහන් අවශ්‍යතාවයන්ට පටහැනි ලෙස පිරිවැය අඩු කඩදාසි භාවිතා කර අදාල ලොතරැයිපත් මුද්‍රණය කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. එසේම මුද්‍රණකරුවන් විසින් නියමිත ප්‍රමිතීන් ආරක්ෂා වන පරිදි අදාල මුද්‍රණයන් සිදුකර නොතිබූ අවස්ථාද වූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. 2019 ජනවාරි 13 දින පැවැත්වූ ගොවිසෙත දිනුම් වාරයේදි අදාල මුද්‍රණකරු විසින් ලොතරැයිපත් 30 ක් දෙවරක් මුද්‍රණය කර සපයා තිබුණි.

ඉදිරියේදී මෙවැනි දෝෂ සම්බන්ධයෙන් මුද්‍රණකරුගෙන් දඩ අයකර ගත හැකි වන පරිදි වගන්තියක් මුද්‍රණ ගිවිසුමට ඇතුළත් කිරීමටද සම්මත මුද්‍රණ අකුරු ශෛලියක් සියළුම ලොතරැයි මුද්‍රණකරුවන්ට ලබා දීමට ද, මාස 04 කට වරක් ලොතරැයි මුද්‍රණය පිළිබඳ දැනුම ඇති කමිටුවක් මඟින් ලොතරැයිපත් මුද්‍රණකරුවන්ගේ කර්මාන්තශාලා පරීක්ෂාවක් සිදු කිරීමටදඒවයේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳවත් මුද්‍රණ ටෙන්ඩරය පිරිනැමීමේ දී අදාල මුද්‍රණකරුවන්ගෙන් එකඟතාවයන් ලබා ගැනීමටද ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

පිරිවිතරයන් ආරක්ෂා වන ආකාරයට ගිවිසුම් ගතවීම හා ඒවා ඉටුකිරිම පරික්ෂා කිරිම.

| | | |
|---|---|---|
| (එ) මණ්ඩලය විසින් ලොතරැයිපත් මිලදී ගන්නන්ගේ ආරක්ෂාවට සියලුම දත්තයන් QR Codeඑකකට ඇතුලත් කර මුද්‍රණයකරන ලෙස මුද්‍රණකරුවන්ට උපදෙස් දී තිබුණද අදාල මුද්‍රණකරුවන් විසින් එම ආරක්ෂිත ක්‍රමවේදය අනුගමනය නොකළ අවස්ථා නිරීක්ෂණය විය.එසේම ජයග්‍රාහකයින් විසින් ඉදිරිපත් කරන ලොතරැයිපත් වෙනුවෙන්ද එම පරික්ෂාව මණ්ඩලය විසින් ඉටු කර නොතිබුණි. | එකඟ විය නොහැක.<br>ලොතරැයි මුද්‍රණයේදී පාරිභෝගික ආරක්ෂාව සඳහා සත්‍ය ලොතරැයි පතක් හඳුනාගැනීම පහසු කරවීමට සහ ඒ තුළින් ඉදිරියේදී ලොතරැයි දිනුම් පිළිබඳ පාරිභෝගිකයන්හට ස්වයංක්‍රීයව වෙබ් අඩවිය හරහා ලොතරැයිපත් දිනුම් සත්‍යාපනය සඳහා ද QR codeලොතරැයිපතට හඳුන්වාදී ඇත.<br>නීරෝගා ලොතරැයිය සමඟ නියමු ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භ කර එහි සාර්ථකත්වය මත පසුව සියළුම ලොතරැයිපත් සඳහා හඳුන්වාදෙන ලදී.<br>Bar Codeඅංක හා ඊට සම්බන්ධ මුද්‍රිත විචල්‍ය දත්තයන් අප ප්‍රධාන තොරතුරු ජාල පද්ධතිය තුළින් හා රජයේ රස පරීක්ෂක වාර්තා මඟින් සනාථ කරගනු ලැබේ.<br>එසේම QR Codeපරීක්ෂාව ස්මාර්ට් ජංගම දුරකථනයක් ආධාරයෙන් නොමිලේ බාගත කල හැකි මෘදුකාංග භාවිතයෙන් ඉතා පහසුවෙන් සිදු කල හැකි අතර ඒ සඳහා විශේෂිත වූ උපකරණ අවශ්‍ය නොවේ.<br>එහෙයින් ඉතා සාර්ථක ප්‍රතිඵල ලබාගෙන ඇති අතර එහි දෙවන පියවර ක්‍රියාත්මක කිරීම සඳහා ද ඉදිරි පියවර ගනිමින් පවතී. | පාරිභෝගිකයන්ටපහසුවෙන් හඳුනාගත හැකි හා ආරක්ෂිත ක්‍රමවේදයන් ඇතුලත් කර ටිකට්පත් මුද්‍රණය කිරීම. |
| (ඒ) මණ්ඩලය විසින් කුළියට ලබාගත් වර්ග අඩි 26000 ක ගොඩනැගිල්ල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව ලබාදුන් මාසික තක්සේරු වටිනාකම රු.3,750,000 ක් වුවද ඒ සඳහා ගෙවනු ලබන මාසික කුලී වටිනාකම රු.7,677,173 ක් විය. එයට යාබදව යකඩ කණු මත ඉදිකළ වර්ග අඩි 4885 ක ගොඩනැගිල්ලක් රු.1,099,125 ක මාසික කුළියට ලබාගෙන තිබුණද එම ගොඩනැගිලි සඳහා වු සැලැසුම, අනුකුලතා සහතිකය, නගරසභා අනුමැතිය හා තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වටිනාකම යනාදිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ප්‍රසම්පාදනයේදි වර්ග අඩි 40,000 කට නොඅඩු යනුවෙන් | ආයතනයේ අවශ්‍යතාවය මත ලබා ගන්නා ලද වර්ග අඩි 26,000 ක ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම රු. 3,750,000.00 ක්වු නමුත් ඒ සඳහා රු.7,677,173.00 ක මුදලක් ගෙවීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයත්, අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හා අමාත්‍ය මණ්ඩල අනුමැතියත් ලබා ගෙන ඇත.<br>ප්‍රධාන ගොඩනැගිල්ලට යාබදව ඉදිකරන ලද වර්ග අඩි 4885ක ගොඩනැගිල්ල සඳහා අනුමත සැලසුමක් හා අනුකුලතා සහතිකය හා නගරසභා අනුමැතිය ලබා ගෙන නොමැත. වර්තමානයේ අවශ්‍ය විදුලි ධාරිතාවය වැඩිකර ඇති අතර විදුලි ජනන යන්ත්‍රයක් භාවිතා නොකරයි. | අදාල ඉදිකිරීම් සම්බන්ධයෙන් තක්සේරු<br>දෙපාර්තමේන්තුවෙන් අනුමත තක්සේරුවක් ලබාගැනීම හා හැකිතාක් පිරිවැය අවම වන පරිදි කටයුතු කිරීම. |

ටෙන්ඩර් කැඳවීම මත බොහෝ ගොඩනැගිලි හිමිකරුවන්ට අයදුම් කිරීමට තිබුණු අවස්ථා අහිමි වී තිබූ අතර අවශ්‍ය විදුලි ධාරිතාවය පිළිබඳ සොයා බලා නොමැති වීම හේතුවෙන් මාසිකව රු.1,011,840 ක විදුලි වියදමක් දරා තිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට ජාතික ලොතරැයි මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ අනුමත නොවූ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ 12 දෙනෙකු වූ අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවකයින් 01 ක්, සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් 11 ක් ඇතුළත් විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරී තනතුර මුදල් අමාත්‍යාංශයේ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විශ්‍රාම යාමෙන් පසුව මාස 06 ක් දක්වා සේවා කාලය දීර්ඝ කිරීම හේතුවෙන් එම නිලධාරිවරයා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ලදී. | අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුවසේවක සංඛ්‍යාව බඳවා ගැනිම. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී අනුමත සේවක සංඛ්‍යාවේ නොමැති සංවර්ධන සම්බන්ධීකරණ නිලධාරී සහ විශේෂ ව්‍යාපෘති උපදේශක ලෙස නව තනතුරු වර්ග 02 ක් සඳහා පිළිවෙලින් නිලධාරීන් තිදෙනෙකු සහ එක් නිලධාරියෙකු බඳවා ගෙන රු.1,200,000 ක් වැටුප් ලෙස ගෙවීම් කර තිබුණි. | සංවර්ධන සම්බන්ධීකරණ නිලධාරී සහ විශේෂ ව්‍යාපෘති උපදේශක තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම මුදල් අමාත්‍යාංශයේ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදු කර ඇත. | සුදුසුකම් මත බඳවා ගැනීමට කටයුතු කිරිම හා අනුමත සේවක සංඛ්‍යාව යාවත්කාලීන කිරීමට පියවර ගැනීම. |
| (ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය නොමැතිව මණ්ඩලයේ අනුමත මූල්‍ය නිලධාරී තනතුර යටපත් කර අලෙවි ප්‍රවර්ධන නිලධාරී තනතුර ඇතිකර තිබුණි. නිශ්චිතව සුදුසුකම් සඳහන් කිරීමෙන් තොරව කළමනාකරණ සහකාර තනතුරක් දරණ අයකු එම තනතුරට 2017 අගෝස්තු 08 දින සිට පත්කර තිබුණි. එම තනතුරට පත්කළ නිලධාරියාගේ වැටුප් වර්ධක 03 ක් විලම්භනය කරන ලෙස නියෝග කර තිබියදී එසේ කටයුතු කිරීමකින් තොරව නව තනතුරේ වැටුප් ගෙවීම් කර තිබුණි. | පැරණි සේවකයින් අභිප්‍රේරණය කිරීමේ අරමුණ පෙරදැරිව හා ආයතනයේ රාජකාරී අවශ්‍යතාවය මත අනුමත තනතුරු සංඛ්‍යාව තුල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තාවකාලිකව තනතුරු නාමය වෙනස් කර උසස්වීම් ලබා දී ඇත. | පරිපාලන විධානයන් අනුව ක්‍රියාත්මක කිරිම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 6.5.1 ඡේදය ප්‍රකාර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ ගිණුම් වර්ෂය අවසාන වී ඊළග වර්ෂයේ පෙබරවාරි 28 දිනට ප්‍රථම ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2019 ජුනි 12 දින විගණනය ට ඉදිරිපත් කර තිබුණි. | ඒකාබද්ධ අරමුදලට කරන ලද ගෙවීමට අදාළව ආදායම් බදු ගණනය කිරීම සම්බන්ධ ප්‍රශ්නයක් මතුවීම හේතුවෙන් ඒ සම්බන්ධව මුදල් අමාත්‍යාංශයෙන් විසඳුමක් ලබා ගැනීමට කල්ගත වීම නිසා මූල්‍ය ප්‍රකාශන අදාළ දිනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරිම. |

### 4.2 සංයුක්ත සැලැස්ම

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදයේ සඳහන් පරිදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත යාවත්කාලීන සංයුක්ත සැලැස්මේ පිටපතක් ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපතිවරයා වෙත යැවිය යුතු වුවත්, මණ්ඩලය විසින් 2018 වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉහත පරිදි ඉදිරිපත් කර නොතිබුණු අතර සකස් කල සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණේ 2018 ජුනි 03 වන දින පැවති රැස්වීමේදීය. | සමාලෝචිත වර්ෂයේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට බාහිර පාර්ශවයක සේවය ලබා ගන්නාලදී.එම සැලැස්ම 2017 නොවැම්බර් මස 06 දින ඉදිරිපත් කර ඇත. එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තවදුරටත් සාකච්ඡා කර නිගමනය කරන ලද කරුණුද ඇතුළත් කර සංයුක්ත සැලැස්ම පිළියෙල කරන ලෙසට කළමනාකරණ රැස්වීමේදී උපදෙස් ලබා දෙන ලදී. පුහුණු වැඩසටහන් පැවැත්වීම, සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා කාලයක් ගත වූ බැවින් නියමිත දිනට පෙර සංයුක්ත සැලැස්ම අදාළ අංශ වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය.<br>කෙසේ වෙතත්, PED/12දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව ප්‍රමාදයකින් තොරව මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එහි පිටපතක් විගණකාධිපති වෙත යැවීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛ උපදෙස් පරිදි සංයුත්ක සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කිරීම. |

### 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ අයවැය වාර්තාවෙහි පිටපතක් රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය | ඉදිරි වර්ෂ වලදී PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර ප්‍රමාදයකින් තොරව නියමිත දිනදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමත කරන ලද අයවැය ලේඛණය අදාල පාර්ශවයන් වෙත ඉදිරිපත් කරන බව දන්වමි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරිම. |

| | | |
|---|---|---|
| ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහ භාණ්ඩාගාරය හා විගණකාධිපතිවරයා වෙත වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර යැවිය යුතු වුවත් එම වාර්තාව නිකුත් කර තිබුණේ 2018 පෙබරවාරි 02 දින දීය. | | |
| (ආ)මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික අයවැය එකිනෙකට සමගාමීව පිළියෙල කළ යුතු වුවත් එසේ සිදුකර නොමැති අවස්ථාද නිරීක්ෂණය විය. | සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික අයවැය හැකිතාක් දුරට එකිනෙකට සමගාමීව පිළියෙල කර ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | - එම - |

**4.4** **අයවැය පාලනය**

---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මහජන සම්පත ලොතරැයියේ දිනුම් ඇදීමට නව දිනුම් ඇදීම් පන්දු බහාලන යන්ත්‍රයක්(Draw Balling Machine) හා අනෙකුත් උපාංග මිලදී ගැනීම සඳහා වෙන්කල රු.මිලියන 87 ක්ද පරිගණක මෘදුකාංග මිලදි ගැනිමට වෙන් කළ රු.මිලියන 15.5 ක ප්‍රතිපාදනයන්ද සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. එසේම පරිගණක දෘඩාංග හා අමතර කොටස් මිලදී ගැනීමටත්, කාර්යාල උපකරණ හා සෙසු භාණ්ඩ හා උපාංග මිලදී ගැනීමටත් හා වෙන්කල ප්‍රතිපාදනයෙන් සියයට 84 ක්ම ඉතිරි වි තිබුණි. | එකඟ විය හැක.<br>මහජන සම්පත ලොතරැයියේ දිනුම් ඇදීම සඳහා නව දිනුම් ඇදීමේ යන්ත්‍රයක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2019 වසරේදී ආරම්භ කරන ලදුව ලංසු කැඳවීම සඳහා ලංසු ලියවිල්ල සකස් කිරීම් අවසන් අදියරේ පවති. | ප්‍රසම්පාදන සැලසුම් නියමිත කාලයට ක්‍රියාත්මක කිරීම. |
| (ආ) සමාලොචිත වර්ෂය තුලදී දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් දිරි ගැන්වීම සඳහා "මහත්මා ඇගැයීම් උත්සවයට" රු.මිලියන 20 ක් වෙන්කර තිබුණද වර්ෂය තුළ එවැනි ඇගැයීම් උත්සවයක් පවත්වා නොතිබුණි. | මහත්මා ඇගයීම් උත්සවය 2018 වර්ෂ අවසානයේ සිදු කිරීමට නියමිතව තිබුණ අතර රට තුළ පැවති වාතාවරණය ආයතනය කෙරෙහි බලපෑමක් සිදුකල හෙයින් මහත්මා සම්මාන උළෙල සංවිධාන කටයුතු හා ඇගයීම් කටයුතු නිසි පරිදි සිදු කරගැනීමට නොහැකි විය. | නිශ්චිතව සැලසුම් කර අදාල ප්‍රතිපාදන වෙන්කර ගැනීම. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ වෙළඳපොලසමීක්ෂණය හා නව ලොතරැයි හඳුන්වාදීම සඳහා වෙන්කල රු.6,000,000 ක ප්‍රතිපාදනවැය නොකොට ඉතිරි වී තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | නිශ්චිතව හඳුනාගෙන අදාල වෙන්කිරිම් සිදු කිරිම. |

**4.5 තිරසාර සංවර්ධන අරමුණු**

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ................................. | ................................................ | ................ |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පැවතුණි.එහෙත් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව සමාලෝචිත වර්ෂයේදී දැනුවත් වී නොතිබුණි. ඒ හේතුවෙන් මණ්ඩලයේ කාර්යයන් සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කර ලඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ලඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට අවකාශ ලැබී නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා අප ආයතනයේ නිලධාරීන් කිසිම විටක දැනුවත් වී නොමැත. ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්නේ නම් නිලධාරීන් සහභාගී කළ හැකි බව දන්වා අදාල පාර්ශවකරුවන් වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. | රේඛීය අමාත්‍යාංශය විමසා කටයුතු කිරීම සුදුසු බව. |